වාර්ෂික වාර්තාව - 2022

ஆண்டறிக்கை - 2022

ANNUAL REPORT – 2022



ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

தேசிய சிறுவர் பாதுகாப்பு அதிகாரசபை

National Child Protection Authority



කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூகவலுப்படுத்துகை அமைச்சு

Ministry of Women, Child Affairs and Social Empowerment

වාර්ෂික වාර්තාව

2022



ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

දැක්ම

ළමුන් සඳහා ළමා හිතකාමී සහ සුරක්ෂිත
පරිසරයක් ගොඩනැගීම

මෙහෙවර

ළමුන් සියලු ආකාරයේ
අපයෝජනයන්ගෙන් නිදහස් බව
තහවුරු කිරීම

2022 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය

අනු අංකය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම්	තනතුරු නාමය සහ පත්වූ කාලය	රාජකාරී කරන ස්ථානයේ ලිපිනය
01	උදයකුමාර අමරසිංහ මහතා	සභාපති, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය (2021.11.22)	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ
02	නීතීඥ සුජාතා අලහප්පෙරුම මහත්මිය	නියෝජ්‍ය සභාපති, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය (2019.12.24)	විශ්‍රාමික මහාධිකරණ විනිසුරු
03	වෛද්‍ය ස්වර්ණා විජේතුංග මහත්මිය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (2020.01.22 - 2021.07.15)	ජ්‍යෙෂ්ඨ මනෝවෛද්‍ය විශේෂඥ (ළමා හා යෞවන) රිජ්වේ ආර්යා ළමා රෝහල, බොරැල්ල කොළඹ 08
04	සුසන්ත බාලපටබැඳි මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (2020.06.15)	අතිරේක සොලිසිටර් ජනරාල්,ජනාධිපති නීතීඥ, නීතිපති දෙපාර්තමේන්තුව, කොළඹ 12
05	අජිත් රෝහණ මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (2021.07.21)	ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය , දකුණු පළාත
06	අශෝකා අලවත්ත මහත්මිය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (2021.07.21)	විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම්
07	ආචාර්ය පවිත්‍රා ගොඩමුන්නේ මහත්මිය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (2021.07.15 - 2022.07.28)	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කැලණිය විශ්ව විද්‍යාලය, කැලණිය
08	ආචාර්ය කපිල බණ්ඩාර මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (2020.01.22 - 2021.07.15)	පීඨාධිපති, අධ්‍යාපන පීඨය,කොළඹ විශ්ව විද්‍යාලය, කොළඹ 07
09	බී.කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (2020.10.19)	කම්කරු කොමසාරිස් ජනරාල් ,කම්කරු දෙපාර්තමේන්තුව, කොළඹ 06
10	හේමාල් කස්තුරිආරච්චි මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (2020.10.29 - 2022.03.02)	අධ්‍යක්ෂ ජනරාල්, මුදල් අමාත්‍යාංශය
11	එච්.ඩබ්.සුධීර නිලංග විතාන මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (2021.08.09)	නියෝජ්‍ය කොමසාරිස්, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල

12	එම්.එච්.ජී.බණ්ඩාර මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (2020.01.22)	අතිරේක ලේකම් (පාලන), කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය, බත්තරමුල්ල
13	වෛද්‍ය සේනක ගුණතිලක මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (2020.01.22 - 2022.07.28)	ළමා රෝග විශේෂඥ, දිස්ත්‍රික් මහ රෝහල, බදුල්ල
14	වෛද්‍ය අජිත් තෙන්නකෝන් මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (2022.07.28)	ප්‍රධාන අධිකරණ වෛද්‍ය

2022 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මූල මණ්ඩලය

අනු අංකය	මූල මණ්ඩල සාමාජිකයන්ගේ නම්	තනතුරු නාමය සහ පත්වූ කාලය	රාජකාරී කරන ස්ථානයේ ලිපිනය
01	එන්.ඒ.විජේනායක මහතා	මූල මණ්ඩල සාමාජික (2020.06.12)	හිටපු ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, කාන්තා හා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය
02	ඒ.එම්.ඩී. සුමනසේන මහත්මිය	මූල මණ්ඩල සාමාජික (2020.05.26)	කොමසාරිස්, ළමා හා කාන්තා අංශය , කම්කරු දෙපාර්තමේන්තුව
03	කේ.පි.එන්.දේවප්‍රිය මහතා	මූල මණ්ඩල සාමාජික (2020.06.11)	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පරිපාලන) අධ්‍යාපන අමාත්‍යාංශය,
04	රෝෂිණී හෙට්ටිගේ මහත්මිය	මූල මණ්ඩල සාමාජික (2020.06.09)	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (නීති) අධිකරණ අමාත්‍යාංශය
05	එම්.සී.එස්. දේවසුරේන්ද්‍ර මහත්මිය	මූල මණ්ඩල සාමාජික (2020.05.26)	නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්), තොරතුරු තාක්ෂණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
06	වී.සී.ද සිල්වා මහත්මිය	මූල මණ්ඩල සාමාජික (2021.01.22)	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය
07	වෛද්‍ය ලාල් පනාපිටිය මහතා	මූල මණ්ඩල සාමාජික (2021.03.17)	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - සෞඛ්‍ය අමාත්‍යාංශය
08	හසිනි පල්ලාවල මිය	මූල මණ්ඩල සාමාජික (2020.05.20)	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පරිපාලන) ආරක්ෂක අමාත්‍යාංශය
09	එම්.ඩී.ජේ.සී.මුරගේ මහතා	මූල මණ්ඩල සාමාජික (2022.10.13)	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ප්‍රවාහන හා පාර්ලිමේන්තු කටයුතු), අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල

අනු අංකය	අන්තර්ගතය	පිටු සංඛ්‍යාව
01	ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපතිතුමාගේ සමාලෝචනය	1 - 1
02	හැඳින්වීම	2 - 3
03	ප්‍රධාන කාර්යයන්	3 - 4
04	සංවිධාන සටහන	5 - 5
05	2022 වර්ෂයේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සංවිධාන ව්‍යුහය	6 - 6
06	2022 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය සහ සේවයේ නියුතු කාර්ය මණ්ඩලය සහ පුරප්පාඩු	6 - 8
07	මූල්‍ය සහ මෙහෙයුම් කාර්ය සාධන විශ්ලේෂණය	8 - 9
	ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන් - 2022	
08	ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රාජ්‍ය අංශයේ නිලධාරීන් දැනුවත් කිරීම	9 - 9
09	ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අදාළව, ජාතික මෙහෙයුම් කමිටුව, පළාත් කමිටු, සහ දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය කමිටු ස්වාධීන තාක්ෂණික කව ලෙස ස්ථාපනය සහ පැවැත්වීම	9 - 9
10	ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අදාළ නීති පද්ධතිය ශක්තිමත් කිරීම.	10 - 10
11	ළමා දිවා සුරැකුම් පහසුකම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම.	10 - 10
12	ප්‍රාදේශීය සහ ග්‍රාමසේවා වසම් මට්ටමින් අවශ්‍යතා ඇති ළමුන් සිතියම්ගත කිරීම.	10 - 10
13	ජාතික දත්ත පද්ධතිය සංවර්ධනය කිරීම	10 - 10
14	ආගමික පූජ්‍ය, පූජක ප්‍රසාදීන් දැනුවත් කිරීමේ නියමු වැඩසටහන	10 - 11
15	ප්‍රාදේශීය මට්ටමින් ප්‍රජාව තුළ ළමා ආරක්ෂාව තහවුරු කිරීමේ ජාතික වැඩසටහන	11 - 11
16	පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවීමේ ජාතික වැඩසටහන (සුරැකුම් පව්ව)	11- 11
17	ජ්‍යෙෂ්ඨ පාසල් ශිෂ්‍ය නායකයන් සඳහා වන ළමා ආරක්ෂාව පිළිබඳ ‘‘ශිෂ්‍ය තානාපති’’ ජාතික වැඩසටහන	11 - 12
18	පාසල් සඳහා මනෝවිද්‍යාව සහ මනෝ සමාජීය වැඩසටහන (ශික්ෂා - ධනාත්මක ශික්ෂණය පිළිබඳ දෙමාපියන් ගුරුවරුන් දැනුවත් කිරීම)	12 - 12
19	හදිසි ආපදා අවස්ථාවලදී ළමා ආරක්ෂාව සහ ළමුන් සඳහා හදිසි සහන වැඩසටහන.	12 - 12
20	ආන්තික, අනාරක්ෂිත අවදානම් හා අදෘශ්‍යමාන ළමුන් සහ ළමා අපයෝජනවලට ලක්වූ ළමුන් සඳහා අධ්‍යාපනික ආධාර ලබාදීම.	12 - 13
21	ස්වෙච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන අධීක්ෂණය හා නියාමනය	13 - 13
22	පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ ඉගෙනුම ලබන වෛද්‍යවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන	13 - 13
23	පොලිස් නිලධාරීන් හා ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරීන් සඳහා ‘‘ ළමා වෙළඳාම හඳුනා ගැනීම, වාර්තා කිරීම සහ විමර්ශනය කිරීම සඳහා පුහුණු විෂය මාලාව, ඉගෙනුම් කාර්යය සංග්‍රහය සහ මෙවලම් මාර්ගෝපදේශය ’’ සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන	13 - 13
24	වැවිලි ක්ෂේත්‍රය ආශ්‍රිතව ළමුන්ගේ යහපැවැත්ම සහතික කිරීම උදෙසා ක්‍රියාත්මක කෙරෙන විශේෂ ප්‍රජා වැඩසටහන	13 – 14

25	ළමා ආරක්ෂාව පිළිබඳ මාධ්‍ය ව්‍යාපාර, තොරතුරු, අධ්‍යාපනය හා සන්නිවේදන මෙවලම් සංවර්ධනය, දින සැමරුම් සහ සිදුවීම්, ප්‍රදර්ශන සහ ජංගම සේවා, නිල වෙබ් අඩවිය, මුහුණු පොත,යුටියුබ් සහ ටුවිටර් පවත්වාගෙන යාම සහ සන්නිවේදන වැඩසටහන්	14 - 16
26	විශේෂ විමර්ශන, විමර්ශන නියාමනය, අපරාධ නඩු කටයුතු පිළිබඳ නියාමනය, ළමා අපයෝජන සහ අධිකරණ ක්‍රියාදාමයන් සහ සයිබර් නියාමන කටයුතු සිදුකිරීම.	16 - 16
27	ළමා හිතකාමී වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකක පිහිටුවීම, නඩත්තු කිරීම සහ අයිතිවාසිකම් උල්ලංඝනය වූ ළමුන් සඳහා සහාය වීම.	16 - 16
28	1929 ශ්‍රී ලංකා ළමා උපකාරක දුරකතන සේවය	16 - 16
29	ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි	16 - 18
30	ජාතික ළමා කේන්ද්‍රීය මනෝසමාජීය සහය සේවාව.	18 - 18
31	වෘත්තිකයන් සඳහා මනෝසමාජීය පුහුණු ලබාදීම සහ IEC මෙවලම් සකස් කිරීම.	19 - 19
32	නවාතැන් පහසුකම් සපයන ආයතන හිමිකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන	19 - 19
33	විගමණික සේවකයින්ගේ ළමුන් සියළු ආකාරයේ සහසිකත්වයන්ගෙන් ආරක්ෂාවීම තහවුරු කිරීමේ ජාතික වැඩසටහන	19 - 19
34	ළමා ආරක්ෂාව පිළිබඳ සම්පත් පුස්තකාලය සංවර්ධනය කිරීම.	19 - 19
35	සුනාමි කැපකරු මාපිය රැකවරණ වැඩසටහන යටතේ සුනාමියෙන් වින්දිත වූ ළමුන්ට උපකාර කිරීම සහ අධීක්ෂණය කිරීම.	19 - 20
36	ජාතික ළමා ආරක්ෂක අරමුදල	20 - 20
37	නීතිමය කර්තව්‍ය	20 - 23
38	විශේෂ පොලිස් විමර්ශන	23 - 24
39	වාර්ෂික ගිණුම්	25 - 47
40	විගණකාධිපතිවරයාගේ වාර්තාව	48 - 55

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපතිතුමාගේ සමාලෝචනය

ළමා අපයෝජන වැළැක්වීම සහ එවැනි අපයෝජනවලට ගොදුරුවූ ළමයින් ආරක්ෂා කිරීම හා ඔවුන්ට ප්‍රතිකාර කිරීම පිණිස ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමෙහි කාර්ය සඳහා සහ සියලු ආකාරයේ වූ ළමා අපයෝජනවලට එරෙහි වූ ක්‍රියාමාර්ග සම්බන්ධීකරණය හා නියාමනය කිරීම සඳහා 1998 අංක 50 දරන ජාතික ළමා ආරකෂක අධිකාරිය පනත මඟින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවන ලදී.

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ 14 වගන්තියට අනුව අධිකාරියට නියමිත වූ කර්තව්‍ය සඳහන් කර ඇත. එහි (අ) වගන්තිය ප්‍රකාරව ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කර අවසන් කරන ලදී. ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය නිලධාරීන් සහ ළමා කටයුතු ක්ෂේත්‍රයේ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 2022 වසරේදී ක්‍රියාත්මක කරන ලදී.

ළමා දිවා සුරැකුම් පහසුකම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම මඟින් ලංකාවේ සියලුම දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඉහළ ගුණාත්මකභාවයකින් පවත්වාගෙන යෑම සිදුකළ හැකිය. මෙම වසරේදී ළමා දිවා සුරැකුම් පහසුකම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ කෙටුම්පත සකස් කරන ලදී.

ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අදාළ නීති පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා 2022 වර්ෂයේදී ළමා කායික දණ්ඩණය සම්බන්ධයෙන් සහ ළමා මාපිය කැපකරු රැකවරණය සම්බධයෙන් සකස් කරන ලද නීති සංශෝධන කෙටුම්පත් සමාලෝචනය කිරීම සිදුකරන ලදී.

2022 වර්ෂයේදීත් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ළමා අපයෝජන වළක්වා ගැනීමට දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සිදුකර ඇත. එමෙන්ම ළමා අපයෝජනය හේතුවෙන් විඳිතභාවයට පත්වූ ළමුන් නැවත සමාජගත කිරීමට අවශ්‍ය මැදිහත්කරණයන් සිදුකරන ලදී.

2022 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 10 ක් පවත්වන ලදී. සමස්තයක් වශයෙන් ගත් කළ 2022 වර්ෂය තුළ ද ළමා ආරක්ෂාව වෙනුවෙන් ක්‍රියා කළ සෑම අංශයකින්ම සැලකිය යුතු කාර්ය සාධනයක් අත්කර ගැනීමට හැකි වූ බව සඳහන් කළ හැකිය. මේ සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයෙන්, රේඛීය අමාත්‍යාංශයෙන්, ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්යමණ්ඩලයෙන් ලැබුණු සහයෝගය අගය කරමි.

උදයකුමාර අමරසිංහ
සභාපති
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

හැඳින්වීම

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මෙම වසරේදී ළමා අපයෝජන වළක්වා ගැනීම සඳහා ළමුන් දැනුවත් කිරීම් පුළුල්ව සිදු කරන ලදී. දැයේ ළමුන්ගේ උපරිම යහපත වෙනුවෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මෙම වසරේදීත් ක්‍රියාත්මක විය.

වර්ෂ 1989 නොවැම්බර් මස 20 වන දින එක්සත් ජාතින්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය,විශ්ව ප්‍රකාශනයක් ලෙස සම්මත කර ගන්නා ලදී. මෙම සම්මුතිය වගන්ති 54 කින් සමන්විත වන අතර, එමඟින් ලොව සෑම ළමයෙකුටම හිමිවිය යුතු අයිතිවාසිකම් මෙන් ම එම අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමෙහිලා රාජ්‍ය සතු වගකීම ද විග්‍රහ කර තිබේ. ළමා අයිතිවාසිකම් සම්මුතිය සම්මත කර ගැනීමෙන් පසුව එම කාලය තුළ පැවති සමාජ තත්ත්වය විමර්ශනය කිරීමේ දී, ළමා වෙළඳාම, ළමා ගණිකා වෘත්තිය, ළමුන් කාමුක චිත්‍රපට සහ ප්‍රකාශන සඳහා යොදා ගැනීම සහ ජාත්‍යන්තර වශයෙන් රහසිගතව සිදු කරන ළමා වෙළඳාම ඉහළ යාම සම්බන්ධයෙන් දැඩි ලෙස සැලකිලිමත් වීම සිදු කරන ලදී. එමෙන්ම ආයුධ සන්නද්ධ අරගලයන් හි දී ළමයින් බලහත්කාරයෙන් යුධ සේවාවෙහි යෙදවීම හෝ බඳවා ගැනීම අන්තර් ජාතික අපරාධයක් ලෙස දැක්වීම ද හඳුනාගන්නා ලදී. මෙම කරුණු සියල්ල කෙරෙහි ම දැඩි ලෙස අවධානය යොමු කරමින් වර්ෂ 2000දී ළමා අයිතිවාසිකම් සම්මුතිය සඳහා ළමුන් සන්නද්ධ අරගලවලට බඳවා ගැනීම වැළැක්වීම සහ ළමා වෙළඳාම, ගණිකා වෘත්තිය සහ ළමයින් කාමුක චිත්‍රපට සඳහා යොදා ගැනීම වැළැක්වීම සම්බන්ධයෙන් අතුරු කෙටුම්පත් ඇතුළත් කරන ලදී.

ශ්‍රී ලංකා රජය ද එක්සත් ජාතින්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සඳහා 1990 වසරේදී අත්සන් කොට තම එකඟතාවය පළ කරන ලදී. 1991 ජූලි 12 වන දින මෙම සම්මුතිය අනුමත විය. ඒ අනුව, ශ්‍රී ලංකාව තුළ ළමා අයිතීන් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම සම්බන්ධයෙන් 1996 වසරේ දෙසැම්බර් මස ළමා ආරක්ෂාව පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායක් පිහිටුවනු ලැබීය. එහි දී කරුණු විමර්ශනය කළ එම කමිටුව ළමා අපයෝජන අවම කිරීම සඳහා අධිකාරී බලතල සහිත රාජ්‍ය ආයතනයක අවශ්‍යතාවය සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කරන ලදී. ඒ අනුව 1998 අගෝස්තු මාසයේදී අධිකරණ ඇමති විසින් ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. 1998 නොවැම්බර් මාසයේදී මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේදී ඒකමතිකව සම්මත විය. ඒ අනුව 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත මඟින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ස්ථාපිත කරනු ලැබීය. 1999 ජූනි මාසයේදී අධිකාරියේ ප්‍රථම සභාපති හා පාලක සභාව පත් කිරීමෙන් පසුව අධිකාරිය ක්‍රියාත්මක විය. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ආරම්භයේ සිට වර්තමානය දක්වාම ළමා අපයෝජන වළක්වා ගැනීම, ළමා අපයෝජනයන් හි දී ඊට අදාළ නිසි පියවර ගැනීම හා විඳින්දින ළමුන් යළි සමාජගත කිරීමට අදාළ කටයුතු වෙනුවෙන් ක්‍රියා කරමින් සිටියි.

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතේ ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් ළමා ආරක්ෂණය සම්බන්ධයෙන් කටයුතු කරන අතර, 2004 දෙසැම්බර් මස 26 වැනි දින ඇති වූ සුනාමි ව්‍යසනය හේතුවෙන් විඳින්දිතභාවයට පත් ළමුන්ගේ අභිවෘද්ධිය සඳහා 2005 අංක 16 දරන සුනාමි (විශේෂ විධිවිධාන) පනත මඟින්ද අධිකාරිය වෙත බලතල හිමිව පවතියි. තවද 2005 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත මඟින් ළමයෙකු ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ලක්වූ විට අධිකාරියට වාර්තා වීමේදී තෙවන පාර්ශවකරුවෙකු වශයෙන් ඊට මැදිහත් වීම සිදුකළ හැකිය.

ළමයින්ගේ උපරිම යහපත වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා ළමා අපයෝජන සිදුවීම් කඩිනම්ව සහ විධිමත්ව වාර්තා කර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට 2010 ජූලි 22 වන දින 1929 ශ්‍රී ලංකා ළමා උපකාරක දුරකථන සේවය පැය 24 පුරාම ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරි

පරිශ්‍රය තුළ ස්ථාපිත කරන ලදී. මෙම දුරකථන සේවය ආරම්භයත් සමඟ සමාජයේ සැඟව පැවති ළමා අපයෝජන සිද්ධි වාර්තා වීම ක්‍රම ක්‍රමයෙන් ඉහළ අගයක් ගැනීම දක්නට ලැබුණි. අද වන විට ලංකාවේ සියලුම දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි ළමා අපයෝජන පිළිබඳ තොරතුරු සහ සිදුවීම් මෙම සේවය හරහා වාර්තා වන අතර, ළමුන් සඳහා උපදේශන සේවාවන් ද මෙමඟින් ලබාගත හැකිය.

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මූලික කාර්යයක් වන ‘‘ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය’’ (National Policy on Child Protection) සඳහා 2019.10.29 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදෙන ලදී. මෙම ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළ පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අවසන් කරන ලදී.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ළමා ආරක්ෂාව වෙනුවෙන් 2022 වසර තුළදීත් ජාතික ක්‍රියාකාරී සැලසුම්වලට අදාළ කාර්යයන් සිදුකර ඇත.

ප්‍රධාන කාර්යයන්

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතට අනුව ජාතික ළමා ආරක්ෂක අධිකාරියට පුළුල් කාර්යභාරයක් පැවරී ඇත. එම කාර්යභාරය පහත සඳහන් කර ඇත. (වගන්ති 14 ප්‍රකාරව)

(අ) ළමා අපයෝජන වැළැක්වීම සහ එවැනි අපයෝජනවලට ගොදුරු වූ ළමුන් ආරක්ෂා කිරීම හා ඔවුන්ට ප්‍රතිකාර කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමෙහිලා රජයට උපදෙස් දීම.
(ආ) ළමා අපයෝජන වැළැක්වීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව රජයට උපදෙස් දීම.
(ඇ) එවැනි අපයෝජනවලට ගොදුරුවූවන් ආරක්ෂා කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව රජයට උපදෙස් දීම.
(ඈ) අපයෝජනවලින් ආරක්ෂා කරනු ලැබීමට ළමුන් සතු අයිතිවාසිකම් පිළිබඳ සහ ළමා අපයෝජන වැළැක්වීමේ ක්‍රම පිළිබඳව දැනුවත් කිරීම.
(ඉ) ළමා අපයෝජන වැළැක්වීමේ කාර්යය සඳහා සහ එවැනි අපයෝජනවලට ගොදුරුවූවන් ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ අයිතීන් රැකගැනීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීම සහ උචිත අවස්ථාවලදී එම කාර්යය සඳහා අදාළ අමාත්‍යාංශවල, පළාත් සභාවල, පළාත් පාලන ආයතනවල, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහ රජයේ හා පෞද්ගලික අංශයේ සංවිධානවල උපදෙස් විමසීම.
(ඊ) ළමා අපයෝජන වැළැක්වීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නීතිමය, පරිපාලනමය හෝ වෙනත් සංශෝධන නිර්දේශ කිරීම.
(උ) සියලු ආකාර ළමා අපයෝජනවලට අදාළ නීති ක්‍රියාත්මක කිරීම නියාමනය කිරීම.
(ඌ) ළමා අපයෝජන හා සම්බන්ධ සියලු විමර්ශන හා අපරාධ නඩු කටයුතුවල ප්‍රගතිය නියාමනය කිරීම.
(එ) සන්නද්ධ ගැටුම්වල බලපෑම්වලට පාත්‍ර වූ ළමයින් සම්බන්ධව මානුෂිකව සැලකිල්ලට ගතයුතු කරුණු පිළිබඳව යොමුවීම සඳහා ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම හා ඔවුන්ගේ මානසික හා ශාරීරික සුබසිද්ධිය සඳහා පියවර ගැනීම ඇතුළුව එවැනි ළමුන්ගේ ආරක්ෂාව සහ ඔවුන් සමාජයට නැවත ඇතුළු කර ගැනීම.
(ඒ) අපරාධ පිළිබඳ විමර්ශනවලට සහ අපරාධ නඩු කටයුතුවලට සම්බන්ධ ළමයින්ගේ ආරක්ෂාව හා රැකවරණය සඳහා, අවශ්‍ය අවස්ථාවලදී උචිත පියවර ගැනීම.
(ඔ) ළමා අපයෝජන පිළිබඳව මහජන පැමිණිලි භාර ගැනීම සහ අවශ්‍ය අවස්ථාවලදී ඒ පැමිණිලි නිසි බලධාරීන් වෙත යොමු කිරීම.

(ඕ) ළමා අපයෝජනවලට එරෙහිව කරනු ලබන දැඩි ව්‍යාපාර සම්බන්ධීකරණය සම්බන්ධයෙන් පළාත් සභාවලට, පළාත් පාලන ආයතනවලට හා රාජ්‍ය නොවන සංවිධානවලට උපදෙස් දීම හා සහාය වීම.

(ක) ළමා අපයෝජන සම්බන්ධව ජාතික දත්ත පදනමක් සකස් කිරීම සහ එය පවත්වාගෙන යාම.

(ග) අදාළ අමාත්‍යාංශ හා වෙනත් ආයතනයන්ගේ උපදෙස් විමසා ළමුන් සඳහා ළමා රැකවරණ සේවා සපයන සියලු ආගමික හා පුණ්‍ය ආයතන අධීක්ෂණය කිරීම හා ඒ පිළිබඳව නියාමනය කිරීම.

(ච) ළමා අපයෝජන සහ ළමයින් ආරක්ෂා කිරීම හා සම්බන්ධ පර්යේෂණ පැවැත්වීම, ප්‍රවර්ධනය කිරීම හා සම්බන්ධීකරණය කිරීම.


(ජ) ළමයින්ගේ සුරක්ෂිතභාවය සහ ළමුන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ජනතාවට තොරතුරු සැපයීම සහ අධ්‍යාපනය ලබාදීම.

(ට) ළමා අපයෝජනවලට ඇති ඉඩ ප්‍රස්ථා අවම කිරීම පිණිස, සංචාරක කටයුතු හා සම්බන්ධ සියලු අංශ සමඟ සංවාදයෙහි යෙදීම.

(ඩ) ළමා අපයෝජන පිළිබඳ වැඩමුළු, සම්මන්ත්‍රණ සහ සාකච්ඡා සංවිධානය කිරීම සහ ඒ සඳහා පහසුකම් සැපයීම.

(ණ) සියලු ආකාර ළමා අපයෝජන අනාවරණය කර ගැනීම හා වැළැක්වීම හා සම්බන්ධයෙන් විදේශ රජයන් සහ අන්තර් ජාතික සංවිධාන සමඟ සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීම සහ තොරතුරු හුවමාරු කර ගැනීම.

2022 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සංවිධාන සටහන



2022 වර්ෂයේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සංවිධාන ව්‍යුහය

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ පහත සඳහන් අංශ ක්‍රියාත්මක වේ.

1 සභාපති හා නියෝජ්‍ය සභාපති කාර්යාලය
2 අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය
3 පරිපාලන හා මානව සම්පත් අංශය
4 මූල්‍ය අංශය
5 සැලසුම් හා තොරතුරු අංශය
    5.1 සැලසුම් හා නියාමන ඒකකය
    5.2 තොරතුරු හා මාධ්‍ය ඒකකය
        5.2.1පුස්තකාලය
6 වැඩසටහන් අංශය
7 මනෝසමාජීය අංශය
8 නීති අංශය
9 නීතිය බලාත්මක කිරීමේ අංශය
    9.1 1929 ශ්‍රී ලංකා ළමා උපකාරක දුරකථන සේවය
    9.2 මධ්‍යම ලේඛනාගාරය
    9.3 වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකකය
    9.4 අන්තර්ජාල ආවේක්ෂණ ඒකකය
10 අභ්‍යන්තර විගණන අංශය
11 විශේෂ පොලිස් විමර්ශන ඒකකය

2022 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය සහ සේවයේ නියුතු කාර්ය මණ්ඩලය සහ පුරප්පාඩු

අංකය	තනතුර	වැටුප් - ක්ත අංකය	අනුමත සංඛ්‍යාව	සේවයේ නියුතු සංඛ්‍යාව	පුරප්පාඩු
01	අධ්‍යක්ෂ ජනරාල්	HM -2-1	01	01	-
02	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්	HM -1-3	01	-	01
03	අධ්‍යක්ෂ - පරිපාලන හා මානව සම්පත්	HM -1-1	01	01	-
04	අධ්‍යක්ෂ - මූල්‍ය	HM -1-1	01	-	01
05	අධ්‍යක්ෂ - නීති	HM -1-1	01	01	-
06	සායනික මනෝවිද්‍යාඥ	HM -1-1	01	-	01
07	අධ්‍යක්ෂ - සැලසුම් හා තොරතුරු	HM -1-1	01	01	-
08	අධ්‍යක්ෂ - වැඩසටහන්	HM -1-1	01	01	-
09	අධ්‍යක්ෂ - නීතිය බලාත්මක කිරීම	HM -1-1	01	01	-
10	සහකාර අධ්‍යක්ෂ - පරිපාලන	MM -1-1	01	01	-
11	සහකාර අධ්‍යක්ෂ - නීති	MM -1-1	01	-	01
12	සහකාර අධ්‍යක්ෂ - වැඩසටහන් (මුදල් අමාත්‍යාංශයට මුදා හැර ඇත)	MM - 1-1	01	01	-
13	සහකාර අධ්‍යක්ෂ - මනෝවිද්‍යා	MM -1-1	01	01	-
14	සහකාර අධ්‍යක්ෂ - සැලසුම් හා නියාමන	MM -1-1	01	01	-
15	සහකාර අධ්‍යක්ෂ - මාධ්‍ය හා තොරතුරු	MM -1-1	01	01	-

16	සහකාර අධ්‍යක්ෂ - නීතිය බලාත්මක කිරීම	MM -1-1	01	01	-
17	ගණකාධිකාරී	MM -1-1	01	01	-
18	අභ්‍යන්තර විගණක	MM -1-1	01	01	-
19	අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්	JM – 1-1	01	01	-
20	පරිපාලන නිලධාරි	JM – 1-1	01	01	-
21	වැඩසටහන් නිලධාරි	JM – 1-1	01	01	-
22	ගිණුම් නිලධාරි	JM – 1-1	01	01	-
23	විමර්ශන නිලධාරි	JM – 1-1	02	01	01
24	මාධ්‍ය හා තොරතුරු නිලධාරි	JM – 1-1	01	01	-
25	සැලසුම් හා නියාමන නිලධාරි	JM – 1-1	01	01	-
26	පර්යේෂණ හා සුබසාධන නිලධාරි	JM – 1-1	01	01	-
27	වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ නිලධාරී	JM – 1-1	01	-	01
28	මනෝසමාජීය නිලධාරී	JM – 1-1	01	-	01
29	සයිබර් අපරාධ විශ්ලේෂක	JM – 1-1	01	-	01
30	සයිබර් විමර්ශන නිලධාරී	JM – 1-1	01	-	01
31	තොරතුරු තාක්ෂණ නිලධාරී	JM – 1-1	01	-	01
32	නීතිය බලාත්මක කිරීමේ නිලධාරී	MA - 4	01	-	01
33	පරිවර්තක - ඉංග්‍රීසි	MA - 4	01	-	01
34	පරිවර්තක - දමිළ	MA - 4	01	-	01
35	දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරි	MA - 3	25	18	07
36	දිස්ත්‍රික් මනෝසමාජීය නිලධාරි	MA - 3	25	14	11
37	ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරි	MA - 3	369	220	149
38	ළමා චින්දිත ආරක්ෂක නිලධාරී	MA - 3	01	-	-
39	පරිපාලන සහකාර	MA - 3	01	01	-
40	ගිණුම් සහකාර	MA - 3	03	02	01
41	මාධ්‍ය සහකාර	MA - 3	03	01	02
42	පුස්තකාලයාධිපති	MA - 3	01	-	01
43	සැලසුම් සහකාර	MA - 3	01	-	01
44	නීති සහකාර	MA - 3	03	01	02
45	විමර්ශන සහකාර	MA - 3	06	-	06
46	උපදේශන සහකාර	MA - 3	15	04	11
47	වැඩසටහන් සහකාර	MA - 3	03	01	02
48	වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ සහකාර	MA - 3	10	03	07
49	අන්තර්ජාල ආවේක්ෂණ සහකාර	MA - 3	02	-	02
50	චිකිත්සක	MA - 3	03	01	02
51	වීඩියෝ තාක්ෂණික සහකාර	MA – 2-1	10	02	08
52	කළමණාකරන සහකාර (තාක්ෂණික)	MA – 2-1	15	06	09
53	තොරතුරු තාක්ෂණික සහකාර	MA – 2-1	02	01	01
54	කළමණාකරන සහකාර (තාක්ෂණික නොවන)	MA – 1-1	32	19	13
55	කළමණාකරන සහකාර (තාක්ෂණික නොවන) යතුරුලියන කටයුතු (සිංහල මාධ්‍ය)	MA – 1-1	10	02	08
56	කළමණාකරන සහකාර (තාක්ෂණික නොවන) යතුරුලියන කටයුතු (දමිළ මාධ්‍ය)	MA – 1-1	10	02	08
57	කළමණාකරන සහකාර - (තාක්ෂණික නොවන) සෝදුපත් බැලීමේ කටයුතු (සිංහල මාධ්‍ය)	MA – 1-1	10	02	08


58	කළමණාකරන සහකාර (තාක්ෂණික නොවන) සෝදුපත් බැලීමේ කටයුතු (දමිළ මාධ්‍ය)	MA – 1-1	10	01	09
59	රියදුරු	PL 3	07	05	02
60	පණිවිඩකරු	PL-1	01	-	01
61	කාර්යාල කාර්ය සහයක	PL-1	03	01	02
62	කාර්යාල කම්කරු	PL-1	02	01	01
මුළු සංඛ්‍යාව			**618**	**331**	**287**


මූල්‍ය සහ මෙහෙයුම් කාර්ය සාධන විශ්ලේෂණය

2022 වසරේ දී ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්යභාරය ක්‍රියාකාරී සැලසුම් 3 ක් යටතේ ක්‍රියාත්මක විය.

01. ජාතික සංවර්ධන ක්‍රියාකාරී සැලසුම (රුපියල් මිලියන 40)
02. 1929 පැය 24 පුරා ක්‍රියාත්මක ළමා දුරකථන සේවයට අදාළ ක්‍රියාකාරී සැලසුම (රුපියල් මිලියන 10.692)
03. ළමුන් සඳහා වන සමාජ ආරක්ෂණ ක්‍රියාකාරී සැලසුම (රුපියල් මිලියන 4) වශයෙන් මූල්‍ය ප්‍රතිපාදන මෙම ක්‍රියාකාරී සැලසුම් 03 සඳහා වෙන් කරන ලදී .

2022 වසරේ දී ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ජාතික සංවර්ධන ක්‍රියාකාරී සැලසුමට අදාළව නිදහස් කර ඇති මුළු අක් මුදල් ප්‍රමාණය - රු.මි 32.420 කි. ඒ අනුව ජාතික සංවර්ධන ක්‍රියාකාරී සැලසුමට අදාළ සත්‍ය මූල්‍ය ප්‍රගතිය රු.මි 25.726 කි.





ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන් - 2022

ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රාජ්‍ය අංශයේ නිලධාරීන් දැනුවත් කිරීම

ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් දිස්ත්‍රික් මට්ටමින් නිලධාරීන් දැනුවත් කිරීම සහ ළමා කටයුතු ක්ෂේත්‍රයේ නිලධාරීන් සඳහා ඒකාබද්ධ ප්‍රවේශයන් ප්‍රවර්ධනය කිරීම මෙහි අරමුණු වේ. ඒ අනුව 2022 වර්ෂයේ දී ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ ජාතික වැඩසටහන යටතේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය නිලධාරීන් ඇතුළත් කර සම්පත් සංචිතයක් සකස් කර අවසන් කරන ලදී. එම සම්පත් සංචිතයේ නිලධාරීන් සඳහා TOT පුහුණු වැඩසටහන් 03 ක් පවත්වන ලදී. ඒ සඳහා සහභාගි වූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව 96 කි.

ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අදාළව, ජාතික මෙහෙයුම් කමිටුව, පළාත් කමිටු, සහ දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය කමිටු ස්වාධීන තාක්ෂණික කව ලෙස ස්ථාපනය සහ පැවැත්වීම

ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළ පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම සකසා අවසන් කර ඇත. ඒ අනුව 2022 වර්ෂයේදී ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව සමඟ 2022.10.25 සාකච්ඡාවක් පවත්වන ලදී. ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළ පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්මේ ඉදිරි කාර්යය සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ ලබා දී ඇත. පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම සිංහල සහ දමිළ භාෂාවන්ට පරිවර්තනය කරන ලදී.

ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අදාළ නීති පද්ධතිය ශක්තිමත් කිරීම.

අධිකරණ ක්‍රියාවලියට සම්බන්ධ වන ළමයින් මුහුණ දෙන ගැටලු නිරාකරණය කිරීමේ ක්‍රමවේදයන් පිළිබඳව ළමයින්ට අදාළව පවත්නා නීතියේ සංශෝධනය විය යුතු ක්ෂේත්‍ර 5ක් හඳුනාගන්නා ලදී. ඒ අනුව 2022 වර්ෂයේදී ළමා කායික දණ්ඩනය සම්බන්ධයෙන් සහ ළමා මාපිය කැපකරු රැකවරණය සම්බධයෙන් සකස් කරන ලද නීති සංශෝධන කෙටුම්පත් සමාලෝචනය කිරීමේ රැස්වීම් 03 ක් පවත්වා ඇත. මෙම කමිටු විශේෂඥ මණ්ඩලයකින් සමන්විතය. පොලිස් නිලධාරීන් සහ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන් සඳහා ළමයින්ගේ වීඩියෝ සාක්ෂි ලබාගැනීම සඳහා සම්මුඛ සාකච්ඡාකරුවන් පුහුණු කිරීමේ දෙදින වැඩමුළුව නිලධාරීන් 63 ක් සඳහා පවත්වා ඇත.

ළමා දිවා සුරැකුම් පහසුකම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම.

ළමා දිවා සුරැකුම් පහසුකම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම මඟින් ලංකාවේ සියලුම දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඉහළ ගුණාත්මකභාවයකින් පවත්වාගෙන යෑම මෙහි අරමුණ වේ. 2022 වර්ෂයේදී මේ සම්බන්ධයෙන් රැස්වීම් 08 ක් පවත්වා ඇත. ළමා දිවා සුරැකුම් පහසුකම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය රේඛිය අමාත්‍යාංශය මඟින් මුදල් අමාත්‍යාංශය වෙත නිර්දේශ හා යෝජනා ලබා ගැනීමට ඉදිරිපත් කරන ලදී.

ප්‍රාදේශීය සහ ග්‍රාමසේවා වසම් මට්ටමින් අවශ්‍යතා ඇති ළමුන් සිතියම්ගත කිරීම.

අවදානම් ළමුන් පිළිබඳ සිතියම්කරණයට අදාළව නියාමන ව්‍යාපෘතියක් කළුතර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත. 2022 වර්ෂයේදී කළුතර දිස්ත්‍රික්කයේ බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පොල්කොටුව සහ බුබුලලන්ද යන ග්‍රාම නිලධාරී වසම් දෙකෙහි නිලධාරීන් 12 දෙනෙකු සඳහා අවදානම් සහිත දරුවන් සිතියම්ගත කිරීම සඳහා මාර්ගගතව ප්‍රශ්නාවලිය සම්පූර්ණ කරන්නේ කෙසේද යන්න පිළිබඳ සාකච්ඡාවක් සහ මූලික පුහුණුවක් ලබා දෙන ලදී.

ජාතික දත්ත පද්ධතිය සංවර්ධනය කිරීම

ළමා අපයෝජනයන්ට අදාළ තොරතුරු, වීඩියෝ සාක්ෂි පටිගත කිරීමට අදාළ තොරතුරු, පොලිස් ස්ථාන සඳහා වාර්තාවන ළමා අපයෝජන පිළිබඳ තොරතුරු සහ අවදානම් සහගත ළමුන් පිළිබඳ තොරතුරු ඇතුළත් ජාතික දත්ත පද්ධතිය සකස් කර ඇත. 2022 වර්ෂයේදී ජාතික දත්ත පද්ධතිය සංවර්ධනය කර ඇත. එසේම එයට අදාළ වැඩිදියුණු කිරීම් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය විසින් සිදු කරන ලදී. පූර්ව පරීක්ෂා කිරීම් (Pre Test) සිදු කරමින් පවතී.

ආගමික පූජ්‍ය, පූජක ප්‍රසාදීන් දැනුවත් කිරීමේ නියමු වැඩසටහන

මෙම වැඩසටහනේ මූලික අරමුණ වන්නේ ළමුන්ට එරෙහිව හිංසනය වැළැක්වීම සඳහා සහ ආගමික ස්ථානවල දී ළමයින්ට සිදුවිය හැකි සියළු ආකාරයේ අපයෝජනයන්ගෙන් ආරක්ෂා කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමයි. 2022 වර්ෂයේදී අනුරාධපුරය, මහනුවර, කුරුණෑගල, ගම්පහ, වවුනියාව, අම්පාර සහ ත්‍රිකුණාමළය යන තෝරා ගන්නා ලද දිස්ත්‍රික්කන්හි මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. වැඩසටහන් 07ම අවසන් කරන ලදී. දැනුවත් කළ ප්‍රතිලාභීන් සංඛ්‍යාව 436 කි.





ප්‍රාදේශීය මට්ටමින් ප්‍රජාව තුළ ළමා ආරක්ෂාව තහවුරු කිරීමේ ජාතික වැඩසටහන

මෙම වැඩසටහනේ මූලික අරමුණ වන්නේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ප්‍රජාව දැනුවත් කිරීම මඟින් සෑම ළමයෙකුම සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් ආරක්ෂා කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමයි. 2022 වර්ෂයේදී මේ යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 108 ක් අවසන් කරන ලදී.

පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවීමේ ජාතික වැඩසටහන (සුරැකුම් පව්ව)

අනිවාර්ය අධ්‍යාපන අයිතිය තහවුරු කිරීම සහ එම ළමුන් ළමා අපයෝජනයෙන් වැළැක්වීමට අවශ්‍ය නිසි ක්‍රියාමාර්ග ගැනීම සහ මෙම පාසල්වල පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවීම අරමුණු වේ. මෙහිදී 2011 අංක 17 චක්‍රලේඛය අනුව අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මෙම වැඩසටහන සිදුකරයි. 2022 වර්ෂයේදී මෙම වැඩසටහනට සමගාමීව මඩකලපුව දිස්ත්‍රික්කයේ ක්‍රියාකාරකම් පිළිබඳ අත්දැකීම් හුවමාරු වැඩසටහනක් පැවැත්වීය. මෙම වැඩසටහන සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන් 83ක් සහභාගි විය. 2022 වර්ෂයේ පාසල් ළමා ආරක්ෂක කමිටු 1035ක් පිහිටුවා ඇත.

ජ්‍යෙෂ්ඨ පාසල් ශිෂ්‍ය නායකයන් සඳහා වන ළමා ආරක්ෂාව පිළිබඳ "ශිෂ්‍ය තානාපති ජාතික වැඩසටහන

ජ්‍යෙෂ්ඨ පාසල් ශිෂ්‍ය නායකයින්ගේ ළමා ආරක්ෂාව පිළිබඳ දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනය කිරීම තුළින් ළමා හිතකාමී පාසල් පරිසරයක් නිර්මාණය කිරීම උදෙසා නිර්මාණය කරන ලද වැඩසටහනක් වේ. ලංකාවේ රාජ්‍ය, අර්ධ රාජ්‍ය, පිරිවෙන්, පුද්ගලික සහ අන්තර්ජාතික පාසල්වල ශිෂ්‍ය නායක නායිකාවන්, ශිෂ්‍යනායක මණ්ඩලභාර ගුරුවරු සහ විදුහල්පතිවරු, ප්‍රමුඛ කරගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි. අධ්‍යාපන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ. 2022 වර්ෂයේදී පාසල් 611ක් මෙම වැඩසටහන සඳහා ලියාපදිංචි වී ඇති අතර පළමු අදියර වන විදුහල්පතිවරුන් සහ ශිෂ්‍ය නායක මණ්ඩලභාර ගුරුවරුන් දැනුවත් කිරීම සඳහා දිස්ත්‍රික් 25ම ආවරණය වන පරිදි පළාත් වැඩසටහන් 7ක් පවත්වන ලදී.





පාසල් සඳහා ළමා මනෝවිද්‍යාව සහ මනෝසමාජීය වැඩසටහන (ශික්ෂා - ධනාත්මක ශික්ෂණය පිළිබඳ දෙමාපියන් ගුරුවරුන් දැනුවත් කිරීම)

"ශික්ෂා" අත්පොත භාවිතා කරමින් ධනාත්මක ශික්ෂණය සම්බන්ධයෙන් පාසල් ප්‍රාථමික ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහන දීපව්‍යාප්තව සිදු කරයි. 2022 වර්ෂයේදී "Child Fund" ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සහ හවුල්කාර සංවිධාන විසින් දෙමාපියන් සඳහා ධනාත්මක ශික්ෂණය පිළිබඳ එක් දේශනයක් 2022 පෙබරවාරි 24 දින දඹුල්ලේදී පවත්වන ලදී. ධනාත්මක ශික්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන යටතේ පළමු අදියර වශයෙන් දිස්ත්‍රික් 25ටම අදාළ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන් දැනුවත් කිරීම සිදුකරන ලදී. මෙහි දෙවන අදියර යටතේ දිස්ත්‍රික් නිලධාරීන් විසින් පළාත් 04ක (සබරගමුව,මධ්‍යම,උතුර සහ උතුරුමැද) ප්‍රාදේශීය නිලධාරීන් දැනුවත් කරන ලදී.





හදිසි ආපදා අවස්ථාවලදී ළමා ආරක්ෂාව සහ ළමුන් සඳහා හදිසි සහන වැඩසටහන.

හදිසි ආපදා තත්ත්වයන්හි දී ළමා ආරක්ෂාව හා යහපැවැත්ම තහවුරු කිරීම උදෙසා සුදුසු ළමා ආරක්ෂණ අවශ්‍යතා සම්පූර්ණ කිරීම මෙහි මූලික අරමුණ වේ. එසේම ළමුන් සඳහා හදිසි සහන ලබාදීම මේ මඟින් සිදුකරයි. 2022 වර්ෂයේදී වැඩසටහන් 25ක් සිදුකර අවසන් කරන ලදී.

ආන්තික, අනාරක්ෂිත අවදානම් හා අදෘශ්‍යමාන ළමුන් සහ ළමා අපයෝජනවලට ලක්වූ ළමුන් සඳහා අධ්‍යාපනික ආධාර ලබාදීම.

ළමා අපයෝජන, විවිධ සමාජීය හා ආර්ථික ගැටළු හේතුකොට වින්දිත, ආන්තික, ආනාරක්ෂිත අවදානම් හා ඇස නොගැටෙන ළමුන්ගේ අධ්‍යාපන අයිතිය සුරක්ෂිත කිරීම සඳහා මෙම වැඩසටහන සිදුකරයි. 1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනත අනුව මෙම අධ්‍යාපන ආධාර සහ

අදාළ සහය ලබාදෙයි. 2022 වර්ෂයේදී ළමුන් 417 දෙනෙකු සඳහා අධ්‍යාපන ආධාර ලබාදෙන ලදී. ළමුන් 231 දෙනෙකු සඳහා එක් ළමයෙකුට රු. 4000 බැඟින් ප්‍රතිපාදන ළමුන් 186 දෙනෙකු සඳහා එක් ළමයෙකුට රු. 6000 බැඟින් ප්‍රතිපාදන යොමුකිරීම සිදුකරන ලදී.

ස්වෙච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන අධීක්ෂණය හා නියාමනය

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතේ 14(ග) වගන්තියට අනුව ළමයින් සඳහා ළමා රැකවරණ සේවා සපයන සියළු ආගමික හා පුණ්‍ය ආයතන අධීක්ෂණය හා නියාමනය කිරීම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත පවරා ඇත. ළමා සංවර්ධන මධ්‍යස්ථාන අධීක්ෂණය හා නියාමනය දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරීන්, දිස්ත්‍රික් මනෝසාමාජීය නිලධාරීන් සහ ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරීන්,පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය සිදුකර මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි. 2022 වසරේ දී ස්වෙච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන නියාමනය සැලසුම් කිරීම සඳහා මධ්‍යම,උතුරු මැද,උතුරු,දකුණු,සබරගමුව,ඌව සහ වයඹ පළාත්වල පළාත් පරිවාස කොමසාරිස්වරුන් ඇතුළු පරිවාස නිලධාරීන් සහ ළමා ආරක්ෂක නිලධාරීන් 280 දෙනෙකු සමඟ සාකච්ඡා 7ක් පවත්වන ලදී. ළමා සංවර්ධන මධ්‍යස්ථානවල ළමුන් සම්බන්ධයෙන් මනෝසමාජීය තක්සේරු කිරීම පිළිබඳව පුහුණු සැසිය මෙම පළාත්වල අදාළ නිලධාරීන් සඳහා මාර්ගගත ක්‍රමයට පවත්වන ලදී. මේ සඳහා නිලධාරීන් 133ක් සහභාගි වී ඇත. 2022 වර්ෂය තුළ ස්වෙච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන 313ක් අධීක්ෂණය හා නියාමනය කරන ලදී.

පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ ඉගෙනුම ලබන වෛද්‍යවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන

ළමුන්ට සිදුවන අපයෝජන සම්බන්ධයෙන් මෙන්ම ඒවා වළක්වාගැනීම සම්බන්ධයෙන්ද විවිධ මැදිහත්වීම් සිදු කිරීමේදී වෛද්‍යවරුන් විසින් විශාල කාර්යභාරයක් ඉටුකරනු ලබයි. එම කාර්යභාරය වඩාත් ශක්තිමත් කිරීම උදෙසා වෛද්‍යවරුන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප දියුණු කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මෙම වැඩසටහන සිදුකර ඇත. 2022 වර්ෂයේදී ළමා ආරක්ෂාව පිළිබඳ පශ්චාත් උපාධි වෛද්‍ය ආයතනයේ අධ්‍යාපනය ලබන වෛද්‍යවරුන් තිස් දෙනෙකු 30 උදෙසා මාර්ගගත ක්‍රමය ඔස්සේ දැනුවත් කිරීමේ වැඩසටහන් 2ක් පවත්වා ඇත.

පොලිස් නිලධාරීන් හා ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරීන් සඳහා "ළමා වෙළඳාම හඳුනා ගැනීම, වාර්තා කිරීම සහ විමර්ශනය කිරීම සඳහා පුහුණු විෂය මාලාව, ඉගෙනුම් කාර්යය සංග්‍රහය සහ මෙවලම් මාර්ගෝපදේශය" සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන

මෙම වැඩසටහනේ මූලික අරමුණ වන්නේ "ළමා වෙළඳාම හඳුනාගැනීම වාර්තා කිරීම සහ විමර්ශනය කිරීම සඳහා පුහුණු විෂය මාලාව, ඉගෙනුම් කාර්යය සංග්‍රහය සහ මෙවලම් මාර්ගෝපදේශය" සම්බන්ධයෙන් නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය කිරීම තුළින් ළමයින් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ළමා හිතකාමීව කටයුතු කිරීමට මඟ පෙන්වීමයි.

2022 වර්ෂයේදී කලුතර,කුරුණෑගල,කිලිනොච්චි,ගාල්ල,පුත්තලම දිසත්‍රික්කයන්හි පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 05 සිදුකර ඇති අතර ප්‍රතිලාභීන් සංඛ්‍යාව 471 කි.

වැවිලි ක්ෂේත්‍රය ආශ්‍රිතව ළමුන්ගේ යහපැවැත්ම සහතික කිරීම උදෙසා ක්‍රියාත්මක කෙරෙන විශේෂ ප්‍රජා වැඩසටහන

වැවිලි ක්ෂේත්‍රය ආශ්‍රිතව ජීවත්වන පවුල් ළමා සුරක්ෂිත පවුල් බවට පත් කරමින්, එහි ජීවත්වන ළමුන් සම්බන්ධ අවදානම් සහ අභියෝග හඳුනාගෙන සියළු ආකාරයේ අපයෝජනයන්ගෙන් ආරක්ෂා කරමින් සතුටින් ජීවත්වන පිරිසක් බවට පත් කිරීම හා ළමා ආරක්ෂක ක්‍රියාවන්හි සක්‍රීයව නිරතවන

සංවේදී නිලධාරීන් පිරිසක් වතු ආශ්‍රිතව ඇති කිරීම මෙහි අරමුණු වේ. 2022 වර්ෂයේදී දැනුවත් කිරීමේ වැඩසටහන් 25ක් පවත්වා ඇති අතර ප්‍රතිලාභීන් සංඛ්‍යාව 928කි.

ළමා ආරක්ෂාව පිළිබඳ මාධ්‍ය ව්‍යාපාර, තොරතුරු, අධ්‍යාපනික හා සන්නිවේදන මෙවලම් සංවර්ධනය, දින සැමරුම් සහ සිදුවීම්, ප්‍රදර්ශන සහ ජංගම සේවා, නිල වෙබ් අඩවිය, මුහුණු පොත, යුටියුබ් සහ ටුවිටර් පවත්වාගෙන යාම සහ සන්නිවේදන වැඩසටහන්

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්යයභාරය , ළමා ආරක්ෂාව සහ ළමා අයිතිවාසිකම් යන විෂයය පථයන් පිළිබඳව ළමුන්, තරුණයින්, දෙමව්පියන්, වැඩිහිටියන්, මහජනතාව, නිලධාරීන්, ව්‍යක්තිකයන්, විශ්වවිද්‍යාල විද්‍යාර්ථයින්, රාජ්‍ය සහ පෞද්ගලික හා රාජ්‍ය නොවන නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන්, පුහුණු වැඩසටහන් සිදුකෙරේ. මෙහිදී ප්‍රවෘත්ති නිවේදන නිකුත් කිරීම, අධ්‍යාපනික, සන්නිවේදන සහ තාක්ෂණික මෙවලම් නිර්මාණය, ළමා ආරක්ෂාවට අදාළ ප්‍රදර්ශන සහ ජංගම සේවා පැවැත්වීම, ළමා අපයෝජන සහ අපචාර සම්බන්ධව දෛනික පුවත්පත් නියාමනය කිරීම සිදු කෙරේ. 2022 වර්ෂයේදී ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ප්‍රවෘත්ති නිවේදන 11ක් නිකුත් කරන ලද අතර ළමා ආරක්ෂාව, අයිතිවාසිකම්, නීතිය, මනෝසමාජීය සහය, සයිබර් අපරාධ සහ කාලීන වශයෙන් ළමා ආරක්ෂාවට බලපාන විවිධ තේමාවන් ඔස්සේ රූපවාහිනී, ගුවන්විදුලි සහ පුවත්පත් සාකච්ඡා 66ක් සඳහා සම්පත් දායකත්වය ලබාදී තිබේ. මෙම වැඩසටහන් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිල යූටියුබ් වැනලය සහ නිල ෆේස්බුක් පිටුව (Subscribers - 1.43K /followers 7.7 K) ඔස්සේද බෙදාහරින ලදී.





ළමා අපචාර සහ අපයෝජන වාර්තා කිරීම සම්බන්ධ දෛනික පුවත්පත් නියාමනය කිරීම සහ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන් අතර බෙදා හැරීම සිදුකරන ලදී. සියලු දිස්ත්‍රික් සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් මුද්‍රණය කරන ලද ප්‍රකාශන බෙදාහරින ලද අතර පුද්ගලයන් 91 දෙනෙකු සඳහා තොරතුරු ලබාදෙන ලදී. 2022 වර්ෂය තුළදී ලෝක ළමා දිනයට සමගාමීව ප්‍රදර්ශන සහ ජංගම සේවා 3ක් පවත්වන ලදී.





දෙහිවල එස් ද එස් ජයසිංහ ක්‍රීඩාංගනය



ජාතික රූපවාහිනී පරිශ්‍රය

2022 වර්ෂයේ ලෝක ළමා දිනයට සමගාමීව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් සංවිධානය කරන ලද සිතුවිලි සිත්තම් සමස්ත ලංකා චිත්‍ර, පෝස්ටර් සහ කාටුන් තරඟාවලියේ අවසන් විනිශ්චය කටයුතු සිදුකර ජාතික මට්ටමේ ජයග්‍රාහකයන් 55ක් සහ දිස්ත්‍රික් ජයග්‍රාහකයන් 737ක් ලෙස සමස්ත ජයග්‍රාහකයන් 792 තෝරාගන්නා ලදී.








ප්‍රථම ස්ථානය
කාණ්ඩය -08 - පෝස්ටර්
සමස්ත ලංකා ජයග්‍රාහක

ප්‍රථම ස්ථානය
කාණ්ඩය -09 - පෝස්ටර්
සමස්ත ලංකා ජයග්‍රාහක

තෙවන ස්ථානය
කාණ්ඩය -10 - පෝස්ටර්
සමස්ත ලංකා ජයග්‍රාහක





ප්‍රථම ස්ථානය
කාණ්ඩය - 05 - චිත්‍ර
සමස්ත ලංකා ජයග්‍රාහක

විශේෂ විමර්ශන, විමර්ශන නියාමනය, අපරාධ නඩු කටයුතු පිළිබඳ නියාමනය, ළමා අපයෝජන සහ අධිකරණ ක්‍රියාදාමයන් සහ සයිබර් නියාමන කටයුතු සිදුකිරීම.

ළමා අපයෝජනවලින් විඳින්දින වූ ළමුන්ගේ රැකවරණය සැලසීම මෙහි ප්‍රධාන අරමුණ වේ. ඒ සඳහා ළමා අපයෝජන සම්බන්ධව විශේෂ විමර්ශනයන් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත ප්‍රකාරව සිදු කරයි. 2022 වර්ෂයේදී ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ විශේෂ පොලිස් විමර්ශන ඒකකය විසින් අධිකරණයේ පෙනී සිටීම් 2658ක් සම්පූර්ණ කර ඇත. (මහාධිකරණ 1173, මහේස්ත්‍රාත් අධිකරණ 1665) ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නීති අංශය විසින් අධිකරණයේ පෙනී සිටීම් 41ක් සහ 1386 දෙනෙකුට නීති සහය ලබාදීම් සිදුකර ඇත. ජාතික ළමා ආරක්ෂක අධිකාරයට පැමිණ සහ දුරකතන මඟින් සයිබර් ආවේක්ෂණ පැමිණිලි 170ක් ලැබී ඇත.

ළමා හිතකාමී වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකක පිහිටුවීම, නඩත්තු කිරීම සහ අයිතිවාසිකම් උල්ලංඝනයවූ ළමුන් සඳහා සහාය වීම.

ළමා අපයෝජන හේතුවෙන් විඳින්දිතභාවයට පත්වන ළමුන් ද්විතීක විඳින්දිතභාවයට පත්වීම වැළැක්වීම මෙහි ප්‍රධාන අරමුණ වේ. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ සහ උතුරු කොළඹ ශික්ෂණ රෝහලේ (රාගම) ළමා පියස පරිශ්‍රයේ නව ළමා හිතකාමී වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකකය මඟින් ළමයින්ගේ සාක්ෂි වීඩියෝ පටිගත කිරීම සිදුකරයි. 2022 වර්ෂයේ වීඩියෝ සාක්ෂි පටිගත කිරීම් 197 අවසන් කරන ලදී. අධිකරණ නියෝග මත සාක්ෂි පට 144ක් නිකුත් කිරීම සිදුකර ඇති අතර, යතුරුලියන පිටපත් 213ක් නිකුත් කිරීම සිදුකර ඇත. වීඩියෝ සාක්ෂි ලබාදීම සඳහා මහාධිකරණවල පෙනී සිටීම් 60ක් සිදුකරන ලදී.

1929 ශ්‍රී ලංකා ළමා උපකාරක දුරකථන සේවය


ළමා අපයෝජන සම්බන්ධ මහජන පැමිණිලි භාර ගැනීම මෙහි ප්‍රධාන අරමුණ වේ. මේ මඟින් කායික, මානසික, ලිංගික අපයෝජන මෙන්ම නොසලකා හැරීම් හා සයිබර් අපයෝජනවලට අදාළ මහජන පැමිණිලි භාරගැනීම පැය 24 පුරා දින 365ම සිදුකරයි. 2022 වර්ෂයේදී 1929 ළමා උපකාරක දුරකථන සේවය වෙත පැමිණිලි 9,574ක් ලැබී ඇත. 1929 ළමා උපකාරක දුරකථන සේවය වෙත ඇමතුම් 115,768ක් ලැබී ඇත.

ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි

ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත ලැබෙන ආකාර කිහිපයකි. එම ක්‍රම පහත සඳහන් කර ඇත.

01. 1929 ශ්‍රී ලංකා ළමා උපකාරක දුරකථන සේවය හරහා ලැබෙන පැමිණිලි.
02. අධිකාරියට පැමිණ ඉදිරිපත් කරන පැමිණිලි.
03. ලිපි, ෆැක්ස්, ඊමේල් මඟින් ලැබෙන පැමිණිලි.
04. සයිබර් ආවේක්ෂණය මඟින් ලැබෙන තොරතුරු.
05. ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරීන් වෙත ලැබෙන පැමිණිලි.

මෙම ලැබෙන පැමිණිලි සියල්ලම සඳහා මූලික කටයුතු සිදුකරන අතර පැමිණිල්ලේ ස්වාභාවය අනුව වර්ග කිරීමක් සිදුකරයි. 2022 වර්ෂයේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියට ලැබී ඇති සමස්ත පැමිණිලි ප්‍රමාණය 10,497කි.



අනු අංකය	වරදේ ස්වභාවය	පැමිණිලි ප්‍රමාණය හා ප්‍රතිශතය
1	අසභ්‍ය ප්‍රකාශන - 286 (අ) දණ්ඩ නීති සංග්‍රහය	**7**
		0.1%
2	සිහමනේ යෙදවීම - 288 දණ්ඩ නීති සංග්‍රහය	**249**
		2.4%
3	ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම - 360 (ආ) දණ්ඩ නීති සංග්‍රහය	**25**
		0.2%
4	මත්ද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා ළමයින් යෙදවීම - 288 (ආ) දණ්ඩ නීති සංග්‍රහය	**41**
		0.4%
5	ළමයින්ට එරෙහි කෲරත්වය - 308 (අ) දණ්ඩ නීති සංග්‍රහය	**2096**
		20.0%
6	ලිංගික අතවර - 345 දණ්ඩ නීති සංග්‍රහය	**729**
		6.9%
7	නීත්‍යානුකූල භාරකාරත්වයෙන් අපහරණය - 352. දණ්ඩ නීති සංග්‍රහය	**131**
		1.2%
8	පැහැරගෙනයාම - 353 දණ්ඩ නීති සංග්‍රහය	**171**
		1.6%

9	ළමයින් වෙළඳාම් කිරීම - 360 (ඇ) දණ්ඩ නීති සංග්‍රහය	**132**
		1.3%
10	ස්ත්‍රී දූෂණය - 363 දණ්ඩ නීති සංග්‍රහය	**167**
		1.6%
11	ව්‍යභිචාරය - 364 (අ) දණ්ඩ නීති සංග්‍රහය	**1**
		0.0%
12	බරපතල ලිංගික අපයෝජනය - 365 (ආ) දණ්ඩ නීති සංග්‍රහය	**185**
		1.8%
13	කුට්ටානියකු ලෙස ළමයින් යෙදවීම - 360 (අ) දණ්ඩ නීති සංග්‍රහය	**0**
		0.0%
14	අස්වාභාවික ලිංගික ක්‍රියා - 365 (අ) දණ්ඩ නීති සංග්‍රහය	**0**
		0.0%
15	ළමයින් නොසලකා හැරීම - 71. ළමා හා යෞවන ආඥා පනත	**2005**
		19.1%
16	ළමා ශ්‍රමිකත්වය - 1956 අංක 47 දරන පනත	**214**
		2.0%
17	අනිවාර්ය අධ්‍යාපනය - 1939 අධ්‍යාපන ආඥා පනත	**1231**
		11.7%
18	ගෘහස්ථ හිංසනය - 2005 අංක 34 දරණ ගෘහස්ථ ප්‍රචණ්ඩ පනත	**82**
		0.8%
19	ළමා වැරදිකරුවන් - ළමා හා යෞවන ආඥා පනත	**229**
		2.2%
20	වෙනත්	**2802**
		26.7%
	එකතුව	**10497**
		100.0%

ජාතික ළමා කේන්ද්‍රීය මනෝසමාජීය සහය සේවාව.

වින්දිත ළමුන් ප්‍රමාණය අවම කිරීම හා ළමුන් අපයෝජනය වීමට ඇති අවදානම වැළැක්වීම, අධ්‍යාපනය, සහ කායිකව හා මානසික සෞඛ්‍ය ඉහළ නැංවීම මෙහි ප්‍රධාන අරමුණු වේ. මෙමඟින් ළමා කේන්ද්‍රීය මනෝසමාජීය සහයක් ළමයින්ට ලබාදෙයි. මෙම සේවාව දිස්ත්‍රික් මනෝසමාජීය නිලධාරීන් සහ ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරීන් මඟින් සිදුකරයි. ළමුන් 828 දෙනෙකුට මනෝසමාජීය මැදිහත්කරණය ලබාදී ඇත, මනෝසමාජීය සහය ළමුන් 117 දෙනෙකුට ලබාදී ඇත. (ගැහැණු - 36 පිරිමි 17) ළමුන් සම්බන්ධ පසු විපරම් 647ක් කර ඇත. වීඩියෝ සාක්ෂි පටිගත කිරීම් සඳහා ළමුන් 36 දෙනෙකු සූදානම් කරන ලදී. වීඩියෝ සාක්ෂි සඳහා පැමිණි පිරිමි ළමයින් 9 දෙනෙකුට මනෝසමාජීය සහාය ලබාදෙන ලදී. වීඩියෝ සාක්ෂි පටිගත කිරීමට පැමිණෙන ළමුන් 33ක් සඳහා අධ්‍යාපන ආධාර ලබාදෙන ලදී.

වෘත්තිකයන් සඳහා මනෝසමාජීය පුහුණු ලබාදීම සහ IEC මෙවලම් සකස් කිරීම.

ළමා ආරක්ෂාව සම්බන්ධ කටයුතු කරන වෘත්තිකයන්ගේ දැනුම යාවත්කාලීන කරමින් වින්දිතභාවයට පත් ළමුන් නැවත ප්‍රතිසාධනය කිරීම මෙහි ප්‍රධාන අරමුණු වේ. 2022 වර්ෂයේදී ළමා අපයෝජන ප්‍රතිසාධන විෂය මාලාවට (Child Abuse Recovery Curriculum) අදාළ දෙමළ පරිවර්තන සහ සිංහල පරිවර්තනය සම්පූර්ණ කර ඇත. පරිවර්තන සමාලෝචනය කරමින් පවතී. NCPA නිලධාරීන් සඳහා මනෝසමාජීය සහය ලබාදීම සඳහා කිට් බෑගය මිලදී ගන්නා ලදී. NCPA මනෝසමාජීය නිලධාරීන්ට ප්‍රතිසාධන පුහුණුකරුවන් ලෙස පුහුණු කිරීමේ (TOT) පළමු වැඩසටහන පවත්වන ලදී. කිට් බෑගය දිස්ත්‍රික්ක 07ක් සඳහා ලබාදෙන ලදී. රාගම වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ මැදිරියට කිට් බෑගය ලබාදෙන ලදී.

නවාතැන් පහසුකම් සපයන ආයතන හිමිකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන

නවාතැන් පහසුකම් සපයන ආයතනවලදී ළමයින්ට සිදුවියහැකි සියළු ආකාරයේ අපයෝජනයන්ගෙන් ළමුන් ආරක්ෂා කිරීම සඳහා එම ආයතන ප්‍රධානීන් මූලික දැනුවත් කිරීමකින් පසුව විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම මෙහි අරමුණ වේ. 2022 වර්ෂයේදී වැඩසටහන් 18ක් සිදු කරන ලදී දැනුවත් කර ඇති ප්‍රතිලාභීන් සංඛ්‍යාව 703 කි.

විගමණික සේවකයින්ගේ ළමුන් සියළු ආකාරයේ සහසිකත්වයන්ගෙන් ආරක්ෂාවීම තහවුරු කිරීමේ ජාතික වැඩසටහන

විගමණික සේවකයින්ගේ ළමුන් සියළු ආකාරයේ සහසිකත්වයන්ගෙන් ආරක්ෂා කිරීම සඳහා ‘‘පවුල් හමු’’ තාක්ෂණික මෙවලම් හඳුන්වාදීමේ වැඩසටහනක් 2022 වර්ෂයේදී ආරම්භ විය. මෙම මෙවලම NISD හි අධ්‍යක්ෂවරයා සමඟ පළමු සාකච්ඡාව පවත්වන ලද අතර, පසුව මෙම වැඩසටහන දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරී, දිස්ත්‍රික් මනෝසමාජීය නිලධාරී සහ ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරීන් සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමක් ලෙස කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ සංවර්ධන නිලධාරීන් සමඟ පැවැත්වීමට සැලසුම් කරන ලදී.

ළමා ආරක්ෂාව පිළිබඳ සම්පත් පුස්තකාලය සංවර්ධනය කිරීම.

උපරිම ගුණාත්මකභාවයකින් යුතුව තොරතුරු, සේවා සහ තොරතුරු මූලාශ්‍ර ලබාදෙමින් ළමා ආරක්ෂාව සම්බන්ධ පර්යේෂණ සඳහා සහය ලබාදීම සිදු කරයි. ආයතනයේ නිලධාරීන්ගේ කියවීමේ රුචිය වර්ධනය කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ. ළමා ආරක්ෂාව, ළමා සංවර්ධනය, නීතිය, මනෝවිද්‍යාව ළමා අයිතීන් ආදී විවිධ ප්‍රමුඛ ක්ෂේත්‍රයන්වලට අදාළ දැනුම වර්ධනය කිරීම ප්‍රධාන අරමුණවේ. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පුස්තකාලය විවිධ ළමුන්, පර්යේෂකයන්, විශ්ව විද්‍යාල සිසුන්, සහ විවිධ පුස්තකාල පරිශීලකයන් දැනුම ලබා ගැනීම සඳහා භාවිතා කරයි. 2022 වර්ෂයේදී පොත් පරිශීලනය සඳහා 200 දෙනෙක් පුස්තකාලය භාවිතා කරන ලදී. පුස්තකාල කබඩ් 04 මිලදී ගැනීම සහ පුස්තකාලය සඳහා පොත් 124 මිලදීගෙන ඇත.

සුනාමි කැපකරු මාපිය රැකවරණ වැඩසටහන යටතේ සුනාමියෙන් වින්දිත වූ ළමුන්ට උපකාර කිරීම සහ අධීක්ෂණය කිරීම.

2005 අංක 16 දරන සුනාමි (විශේෂ විධිවිධාන) පනත යටතේ අධ්‍යාපනික ආධාර ලෙස මාසිකව ලබාදීමට කටයුතු කර ඇත. සුනාමි ව්‍යසනයෙන් වින්දිතභාවයට පත්වූ ළමුන්ගේ භාරකාරිත්වය පරීක්ෂාවට ලක්කරමින් ළමුන්ගේ උපරිම යහපත තහවුරු කෙරෙන භාරකාරිත්වය හා රැකවරණය සඳහා නිර්දේශ සැපයීම සහ සැමට අධ්‍යාපනය යන තිරසර තේමාව යටතේ සුනාමි ව්‍යසනයෙන් වින්දිත ආන්තික හා අනාරක්ෂිතභාවයට පත්වූ ළමුන් සඳහා අධ්‍යාපන පහසුකම් සැපයීම හා ඔවුන්ගේ අධ්‍යාපන අයිතීන් ආරක්ෂා කිරීම මෙහි ප්‍රධාන අරමුණු වේ. 2022 වර්ෂයේදී ළමුන් 25 දෙනෙකුට

අධ්‍යාපන ආධාර ලබාදෙන ලදී. දිස්ත්‍රික් සුනාමි කැපකරු මාපිය රැකවරණ මණ්ඩල අම්පාර, මඩකලපුව,ගාල්ල, මාතර, හම්බන්තොට යන දිස්ත්‍රික්ක සඳහා පවත්වන ලදී.

ජාතික ළමා ආරක්ෂක අරමුදල

2011 වර්ෂයේ පිහිටුවා ඇති ජාතික ළමා ආරක්ෂක අරමුදල ක්‍රමවත් කිරීම සඳහා 2022 වර්ෂයේදී මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කර 219/05 අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මඟින් අනුමැතිය ගෙන ඇත. මෙමඟින් සෑම අකාරයකම උපකාර සහ ආධාර අවශ්‍ය ළමුන් සඳහා සහයෝගය ලබාදීමට අපේක්ෂා කෙරේ. මේ සඳහා මුල්‍ය ආධාර ලබා ගැනීමට කටයුතු කර ඇත.

නීතිමය කර්තව්‍යයන්

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනත යටතේ පිහිටුවන ලද ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නීති අංශය විසින් අධිකාරි පනතේ 14 වගන්තියේ කර්තව්‍යන්ට අමතරව පහත පනත් වලට අදාළවද කටයුතු කරනු ලබයි.

- 2005 අංක 16 දරන සුනාමි (විශේෂ විධිවිධාන) පනත හා
- 2005 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත

2007 අංක 56 දරන සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය පනතේ ප්‍රතිපාදන ආශ්‍රයෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ළමයාගේ උපරිම යහපත උදෙසා කටයුතු කිරීම ප්‍රවර්ධනය කිරීම මඟින් ළමුන්ගේ ආරක්ෂාව සහතික කිරීමට කටයුතු කරනු ලබයි.

අධිකාරියේ නීති අංශයේ කාර්යයන්,

- ළමා ආරක්ෂාව සඳහා වැළැක්වීමේ යාන්ත්‍රණය හා
- ප්‍රතිචාර දැක්වීමේ යාන්ත්‍රණය

ලෙස වර්ග කළ හැකිය.

<u>නීතිමය කර්තව්‍යන්</u>

➢ ළමා අපයෝජන වැළැක්වීම සඳහා සහ එවැනි අපයෝජනවලට ගොදුරුවූවන්ගේ ආරක්ෂාව සඳහා ගතයුතු පියවර පිළිබඳ රජයට උපදෙස් දීම.

- බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව - 11
- මුස්ලිම් හා ආගමික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව - 1
- පොලිස් දෙපාර්තමේන්තුව - 2
- මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය - 1
- පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව - 12
- අධ්‍යාපන අමාත්‍යාංශය - 17

➢ ළමා අපයෝජනය වැළැක්වීමේ ජාතික ප්‍රතිපත්තිය ඵලදායීව ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය නීතිමය, පරිපාලනමය හෝ වෙනත් සංශෝධන නිර්දේශ කිරීම.

- අධිකරණ ක්‍රියාවලියට සම්බන්ධ වන ළමයින් මුහුණදෙන ගැටලු නිරාකරණය කිරීමේ ක්‍රම වේදයන් පිළිබඳව ළමයින්ට අදාළව පවත්නා නීතියේ සංශෝධනය වියයුතු ක්ෂේත්‍ර හඳුනා ගනිමින් විශේෂ මණ්ඩලයකින් යුතු කමිටු පිහිටුවීමට කටයුතු කරන ලදී .ඒ අනුව 2022 වර්ෂයේදීළමා කායික දණ්ඩණය සම්බන්ධයෙන් සහ ළමා මාපිය කැපකරු රැකවරණය සම්බන්ධයෙන් නීති කමිටු විසින් සිදුකරන ලද නීති සංශෝධන කෙටුම්පත් සමාලෝචනය කිරීමේ රැස්වීම් පවත්වා ඇත .

➢ ළමා ආරක්ෂාව සම්බන්ධ ප්‍රඥප්ති, ප්‍රතිපත්ති, නීති, රෙගුලාසි හා චක්‍රලේඛ සඳහා පහසුකම් සැලසීම, අධීක්ෂණය හා සම්බන්ධීකරණය.

➢ ළමා ආරක්ෂාව පිළිබඳ ගැටලු වෙනුවෙන් උද්දේශනය සහ බලපෑම් කිරීම ඇති කිරීම.

➢ ළමයින්ගේ ආරක්ෂාව සම්බන්ධව ශ්‍රී ලංකා රජයේ ජාත්‍යන්තර බැඳීම් පිළිබඳ අවසාන නිරීක්ෂණයන්ට හා නිර්දේශයන්ට ප්‍රතිචාර දැක්වීමට පහසුකම් සැලසීම.

1. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (UNCRC) හා එහි වෛකල්පිත සන්ධානයන් 2
2. කාන්තාවන්ට එරෙහි සියලුම ආකාරයේ වෙනස් කොට සැලකීම තුරන් කිරීමේ සම්මුතිය (CEDAW)
3. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (ICCPR)
4. එක්සත් ජාතීන්ගේ අන්තර් ජාතික සංවිධානාත්මක අපරාධවලට එරෙහි සම්මුතිය (UNTOC)
5. යුරෝපා හවුලේ GSP + සහන ක්‍රමය

➢ නීතිය හා ළමයා පිළිබඳ පාසල් විෂය මාලාව සැකසීමට අදාළව පහසුකම් සැලසීම.

➢ ළමා ආරක්ෂාව පිළිබඳ ගැටළු සම්බන්ධයෙන් නීති උපදෙස් හා සහයෝගය ලබාදීම.

- 2022 වර්ෂයේදී දුරකථනය මාර්ගයෙන් නීති උපදෙස් ලබාදීම් - 1315
- නීති අංශයට පැමිණි සේවාලාභීන් හට නීතිමය උපදෙස් ලබාදීම් - 58

➢අපයෝජනයට ගොදුරුවූ ළමයින් හට, සුනාමියෙන් බලපෑමට ලක්වූ ළමයින් හට උපදෙස් හා නීති සහායන් ලබාදීම, ගෘහස්ත ප්‍රචණ්ඩත්වයට බඳුන් වූ ළමුන් හා ළමා ශ්‍රමය සම්බන්ධ ක්‍රියාවලදී නීතිමය සහාය ලබාදීම සහ අදාළ සම්බන්ධීකරණයන් සිදුකිරීම.

➢ පහත පනත්හි විධි විධාන කිසිවක් උල්ලංඝණය වීම මඟින් සිදුවන ළමා අපයෝජන සිද්ධීන්ට අදාළ පැමිණිලි මෙහෙයවීම
  - ස්ත්‍රීන් තරුණ අය හා ළමයින් සේවයේ නියුක්ත කිරීමේ පනත
  - ළමයින් සහ යෞවනයන් පිළිබඳ ආඥා පනත
  - අධ්‍යාපන ආඥා පනත යටතේ සාදන ලද අනිවාර්ය අධ්‍යාපනයට අදාළ නියෝග

<u>2022 වර්ෂයේදී පැමිණිලි මෙහෙයවීම</u>

- 1929 මඟින් නීති අංශයට යොමු වූ මුළු පැමිණිලි සංඛ්‍යාව - 3020
- 2011 – 2021 දක්වා කාලය තුළ වාර්තා වූ පැමිණිලි සඳහා පසු විපරම් සංඛ්‍යාව - 552

- 2011 – 2021 දක්වා කාලය තුළ ලද පැමිණිලි අතරින් ගොනු අවසන් කර ඇති පැමිණිලි සංඛ්‍යාව - 1140
- 2022 වර්ෂයේ නීති අංශයට යොමුකළ පැමිණිලි අතරින් 2022 වර්ෂය තුළ අවසන් කළ පැමිණිලි සංඛ්‍යාව - 1052

➢ **නීතිමය කාරණාවලදී ජාතික ළමා ආරක්ෂක අධිකාරිය නියෝජනය කිරීම**

- අධිකරණ - මහේන්ත්‍රාත් අධිකරණ සහ දිසා අධිකරණ
- කොමිසන් සභා - ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව, පුවත්පත් කොමිෂන් සභාව
- කම්කරු විනිශ්චය සභා

2022 වර්ෂයේදී අධිකාරිය නියෝජනය කරමින් අධිකරණයන් ඉදිරියේ සිදුකළ පෙනී සිටීම් සංඛ්‍යාව

අනු අංකය	අධිකරණය	අධිකරණයේ පෙනී සිටීම් සංඛ්‍යාව
1	බත්තරමුල්ල ළමා මහේස්ත්‍රාත් අධිකරණය	25
2	මහර මහේස්ත්‍රාත් අධිකරණය	02
3	හෝමාගම මහේස්ත්‍රාත් අධිකරණය	02
4	කැස්බෑව මහේස්ත්‍රාත් අධිකරණය	02
5	දඹුල්ල මහේස්ත්‍රාත් අධිකරණය	01
6	ගංගොඩවිල මහේස්ත්‍රාත් අධිකරණය	01
7	මිනුවන්ගොඩ මහේස්ත්‍රාත් අධිකරණය	04
8	කොළඹ දිසා අධිකරණය	02
9	අභියාචනාධිකරණය	02
මුළු සංඛ්‍යාව		**41**

➢ ළමයින් පිළිබඳව මාධ්‍ය වාර්තා කිරීම්හි නීත්‍යානුකූලභාවය අධීක්ෂණය කිරීම

- 2022 වර්ෂයේදී නීතිමයභාවය පරීක්ෂා කිරීම් - 2433ක් සිදුකර ඇත.

- ගැටළුකාරී නීති විරෝධී මාධ්‍ය වාර්තාකරණයෙන් වැළකීම පිළිබඳව මාධ්‍ය ආයතන වෙත නීතිමය මඟපෙන්වීම් 02ක් සිදු කර ඇත.

➢ අධිකාරියේ විශේෂ පොලිස් විමර්ශන ඒකකය විසින් යොමුකරන ලද උදෘත ගොනුවල නීත්‍යානුකූලභාවය අධීක්ෂණය කිරීම් - 42
➢ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නීතිමය ලියකියවිලි සකස් කිරීම
- අවබෝධතා ගිවිසුම් - 13
- නීතිමය ලියකියවිලි - 90
- ලිපි සකස් කිරීම් - 1164

➢ ළමා අපයෝජන පිළිබඳ අපරාධ නඩු විභාගයන් අධීක්ෂණය කිරීම
ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතේ 14 (ඌ) වගන්තිය යටතේ ළමා අපචාර හා සම්බන්ධ අපරාධ නඩු කටයුතුවල ප්‍රගතිය නියාමනය කිරීම සඳහා අධිකාරිය වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දිවයිනේ මහාධිකරණයන්හි මේ වනවිට පවත්නා ළමා අපයෝජන නඩු සියල්ලෙහි තොරතුරු රැස්කර දත්ත පද්ධතියකට ඇතුළත් කිරීමේ කටයුතු අරඹා ඇත .

➢ සම්පත්දායකයන් බවට පත්වීමෙන් ළමා අයිතිවාසිකම් හා ළමයින් ආශ්‍රිත නීති රෙගුලාසි හා චක්‍රලේඛ ආදිය පිළිබඳ දැනුම හා කුසලතා බෙදා හැරීම තුළින් දැනුවත් කිරීම සිදු කිරීම.
➢ නීති අංශයට යොමු කෙරුණු මහජන පැමිණිලි අතරින් අධ්‍යාපන ආධාර අවශ්‍යතා ඇති ළමයින් සම්බන්ධයෙන් නිර්දේශ ලබාදීම් - 506

විශේෂ පොලිස් විමර්ශන

ජාතික ළමා ආරක්ෂක අධිකාරියට, 1929 ශ්‍රී ලංකා ළමා උපකාරක දුරකථන සේවය ඔස්සේ හා වෙනත් ක්‍රම මඟින් ලැබෙන ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි කඩිනමින් විමර්ශනය කර නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ විශේෂ පොලිස් විමර්ශන ඒකකය කටයුතු කරමින් ඇත.

2022 වර්ෂයේ දී විශේෂ පොලිස් විමර්ශන ඒකකය මඟින් විමර්ෂණය කරන ලද පැමිණිලි සම්බන්ධ වාර්තාව

අනු අංකය	වරද	වාර්තා වූ ගණන	විමර්ශනය වන ගණන	විමර්ශනය අවසන් ගණන	අසත්‍ය	අධිකරණයට යොමුකළ ගණන	අධිකරණයේ කැඳවන ගණන	බැහැර පොලිස් ස්ථානවලට විමර්ශන සඳහා යොමු කළ
01	සුළු අපරාධ	3	-	3	-	3	3	-
02	විවිධ පැමිණිලි	-	-	-	-	-	-	-

03	බල අපරාධ	26	7	19	-	26	26	-
මුළු සංඛ්‍යාව		**29**	**7**	**22**	**-**	**29**	**29**	**-**

2022/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. පොදු තොරතුරු

1998 අංක 50 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත යටතේ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවා ඇති අතර එහි ප්‍රධාන කාර්යාලය අංක 330, තලවතුගොඩ පාර, මාදිවෙල, ශ්‍රී ජයවර්ධනපුර යන ලිපිනයේ පිහිටා ඇත.

2. ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අනුගමනය කරන ලද මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත සඳහන් කර ඇත. අන්‍යාකාරයකින් සඳහන් කර ඇත්නම් මිස, මෙහි සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සියලුම වර්ෂයන් සඳහා අඛණ්ඩව අදාළ කරගෙන ඇත. මූල්‍ය ප්‍රකාශනවලට මූල්‍ය තත්ත්වය (ශේෂ පත්‍රය), මූල්‍ය කාර්යසාධනය (ආදායම් ප්‍රකාශය), හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් ආදිය ඇතුළත් වේ.

3. සකස් කිරීමේ පදනම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිය අනුව මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කෙරේ. 1972 අංක 28 දරණ දේශීය ආදායම් පනතේ 8(අ) (xxvi) වගන්තිය සහ 42 (ඊ) වගන්තිය මඟින් සලසා ඇති විධිවිධාන යටතේ ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය ආදායම් බද්දට යටත් නොවේ. මූල්‍ය ප්‍රකාශ පිරිවැය පදනම යටතේ සකස් කෙරේ.

<u>ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ගිණුම් පිළියෙල කිරීමේදී පහත සඳහන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කර ඇත.</u>

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 1 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

මෙම ප්‍රමිතිය මඟින් ආයතනයේ පූර්ව කාල පරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශන, අනෙකුත් ආයතනවල මූල්‍ය ප්‍රකාශන සමඟ සංසන්දනය කිරීම තහවුරු කිරීම සඳහා පොදු මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු ආකාරය නිශ්චිතව දක්වයි. මෙම අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා මෙම ප්‍රමිතිය මඟින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම, ඒවායේ ව්‍යුහය සම්බන්ධයෙන් මාර්ගෝපදේශ සැපයීම සහ ගිණුම්කරණ උපචිත පදනම යටතේ සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගතය සඳහා වන නියමයන් සම්බන්ධයෙන් සමස්ථ සලකා බැලීම් ඉදිරිපත් කරයි. පිළිගැනීම, මිනුම්ක්‍රම සහ විශේෂිත ගනුදෙනු හෙළිදරව් සහ අනෙකුත් කාරණා මේ යටතට අයත් වේ.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 2 - මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය මඟින් මුදල් ප්‍රවාහ මූලාශ්‍ර, වාර්තාකරණ කාල පරිච්ඡේදය තුළ මුදල් වියදම් කර ඇති අයිතමයන් සහ වාර්තා කරන දිනට මුදල් ශේෂය හඳුනාගනියි. ආයතනයක මුදල් ප්‍රවාහ පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නන්ට වගකීම සහ තීරණ ගැනීමේ අරමුණු සඳහා ප්‍රයෝජනවත් වේ. මුදල් ප්‍රවාහ තොරතුරු මඟින් රාජ්‍ය අංශයේ ආයතනයක් තම ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය අරමුදල් රැස් කරන්නේ කෙසේද යන්න සහ එකී මුදල් භාවිතා කරන්නේ කවරාකාරයටද යන්න පිළිබඳ නිශ්චය කිරීම සඳහා පරිශීලකයන්ට අවස්ථාව සලසයි. ආයතනයේ ක්‍රියාකාරකම්වල තිරසාරභාවය ආදී සම්පත් වෙන් කිරීම් පිළිබඳ තීරණ ගැනීමේදී සහ තොරතුරු ඇගයීමේදී පරිශීලකයන්ට මුදල් ප්‍රවාහවල කාලය සහ නිශ්චිත බව පිළිබඳ අවබෝධයක් අවශ්‍ය වේ. මෙම ප්‍රමිතියේ අරමුණ වන්නේ මෙහෙයවීම, ආයෝජනය සහ මූල්‍යකරණ ක්‍රියාකාරකම් සිදු කරන කාලපරිච්ඡේදය තුළ මුදල් ප්‍රවාහයන් වර්ගීකරණය කරනු ලබන මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් මඟින් ආයතනයේ මුදල් සහ මුදල් සමාන දෑ වල ඓතිහාසික වෙනස්කම් පිළිබඳව අවශ්‍ය තොරුතුරු සැපයීමයි.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 3 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් සහ දෝෂ

මෙම ප්‍රමිතිය මඟින් ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ වෙනස් කිරීම සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම් හෙළිදරව් කිරීම සහ මූල්‍ය ගනුදෙනු මෙහෙයවීම නිශ්චය කිරීමේදී භාවිතා කළ යුතු රීති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස් කිරීම දෝෂ නිවැරදි කිරීම ආදිය සඳහා නිර්ණායක නියම කරයි. තවද, මෙම ප්‍රමිතිය මඟින් ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවල අදාළත්වය සහ විශ්වාසනීය බව ඉහළ නැංවීමට අපේක්ෂා කරන අතර, එම මූල්‍ය ප්‍රකාශන කාලානුරූපීව අනෙකුත් ආයතනවල මූල්‍ය ප්‍රකාශන සමඟ සංසන්දනය කිරීමට ද උපකාරී වේ.

1. ක්ෂය කිරීම

ඉඩම්, ක්ෂය කිරීම්වලට යටත් නොවේ. අනෙකුත් වත්කම් ඒවායේ ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය මත සරල මාර්ග ක්‍රමයට පහත සඳහන් පරිදි ක්ෂය කරනු ලබයි. යම් දේපළ, පිරියත සහ උපකරණ මිලදීගත් අවස්ථාවේ සිට එය භාවිතයෙන් ඉවත් කරන තෙක් ඒ සඳහා ක්ෂය ප්‍රතිපාදන සලසනු ලබයි.

ගොඩනැගිලි	2%
මෝටර් රථ	10%
කාර්යාල ලී බඩු	15%
කාර්යාල උපකරණ	15%
පරිගණක සහ උපාංග	25%
ක්‍රීඩා භාණ්ඩ	15%
සංගීත භාණ්ඩ	25%
කෘෂි උපකරණ	25%

නිශ්චිත පරිත්‍යාගශීලි නියෝජිතායතන සමඟ අත්සන් තබා ඇති ගිවිසුමට අනුව ව්‍යාපෘති අරමුදල් භාවිතා කර මිලදීගත් අයිතමයන්, පිරියත සහ උපකරණ කිසිවක් ජාතික ළමා ආරක්ෂණ අධිකාරියේ ගිවිසුම්වලට ඇතුළත් නොවේ. ව්‍යාපෘති අරමුදල් යටතේ මිලදීගත් දේපළ, පිරියත සහ උපකරණ අදාළ පරිත්‍යාගශීලි නියෝජිතායතනය වෙත අයත්ය. එම උපකරණවල හිමිකාරත්වය ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය වෙත පවරන තෙක් ව්‍යාපෘති සඳහා වෙනම වත්කම් ලැයිස්තු පවත්වාගෙන යනු ලැබේ.

2. ක්‍රමක්ෂය

බදු කාල පරිච්ඡේදය පදනම් කරගනිමින් ඉඩම් ක්‍රමක්ෂය කරනු ලැබේ. අනෙකුත් වත්කම් පහත සඳහන් ක්ෂය අනුපාත යටතේ ක්‍රමක්ෂය කරනු ලැබේ.

<u>ඉඩම් පිළිබඳ තොරතුරු බදු කාල පරිච්ඡේදය (වර්ෂ)</u>

ඉඩම් (2000)	50
ඉඩම් (2016)	30

<u>අනෙකුත් වත්කම් ක්‍රමක්ෂය අනුපාතය</u>

ගොඩනැගිලි	2%
මෝටර් රථ	10%

කාර්යාල ගෘශ භාණ්ඩ	15%
කාර්යාල උපකරණ	15%
පරිගණක සහ උපාංග	25%
ක්‍රීඩා භාණ්ඩ	15%
සංගීත භාණ්ඩ	25%
කෘෂි උපකරණ	25%

ගිණුම් සඳහා සටහන්

සටහන 01:- ක්‍රමක්ෂය

වන්දි ගෙවීමට අපේක්ෂිත අදාළ පිරිවැය ආයතනය විසින් වියදම් වශයෙන් හඳුනා ගැනෙන අතර ප්‍රදාන, කාල පරිච්ඡේදය පුරා ලාභ හෝ අලාභ පදනම මත හඳුනා ගැනේ.

සටහන 02 - අවිනිශ්චිත වගකීම්

සේවා තහනමකට යටත් කළ සේවකයෙකු සම්බන්ධයෙන් විභාග වන නඩුවට අදාළ අවිනිශ්චිත වගකීම් අධිකාරිය සතුය.

සටහන 03 - විලම්භීත ආදායම්

2022 ස්ථාවර වත්කම්වලට සාපේක්ෂව වාර්ෂික ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය වටිනාකම, සටහන ‘‘1 ආ" හි දක්වා ඇති විවිධ ආදායම් ගිණුමට ඇතුළත් කර ඇත.

සටහන 04 - උපචිත වියදම්

2023.01.31 දිනට වාර්තාගත වූ උපචිත වියදම් පමණක් මුළු උපචිත වියදම් වශයෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් වේ.

සටහන 05- පාරිතෝෂික ප්‍රතිපාදන

වසරක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයන් සඳහා 2022 වසර සඳහා පාරිතෝෂික වෙන් කිරීම් ගණනය කර ඇත.

සටහන 06- අවසන් තොග

ලිපිද්‍රව්‍ය අවසන් තොග ‘‘සාමාන්‍ය පිරිවැය පදනම’’ මත අගය කර ඇත.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

		රුපියල්	රුපියල්
විස්තරය	**සටහන්**	**2022**	**2021**
ආදායම			
පුනරාවර්තන ප්‍රදාන - මහා භාණ්ඩාගාරය		274,380,000.00	249,600,000.00
- අනෙකුත් ආයතන	1A	436,612.00	552,975.00
අනෙකුත් ආදායම	1B	18,399,836.87	17,306,116.83
ජාතික ක්‍රියාකාරී සැලැස්ම සඳහා භාණ්ඩාගාර ප්‍රදාන		31,027,255.90	24,300,000.00
ජාතික ළමා ආරක්ෂක අරමුදල සඳහා ප්‍රදාන	1C	202,943.76	18,380.00
මුළු ආදායම		**324,446,648.53**	**291,777,471.83**
වියදම්			
පරිපාලන වියදම්	2	264,162,936.01	229,747,957.81
අනෙකුත් මෙහෙයුම් වියදම්	3	70,102,684.18	62,302,800.73
ව්‍යාපෘති වියදම්	4	436,612.00	552,975.00
ජාතික ළමා ආරක්ෂක අරමුදලේ වියදම්	5	-	-
මූල්‍ය වියදම්	6	-	-
මුළු වියදම්		**334,702,232.19**	**292,603,733.54**
කාලච්ඡේදයට අදාළ ශුද්ධ අතිරික්තය / (ඌනතාවය)	7	**(10,255,583.66)**	**(826,261.71)**

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

2022.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

		රුපියල්	රුපියල්
විස්තරය	**සටහන්**	**2022**	**2021**
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල පිරියත හා උපකරණ	8	190,748,784.93	91,926,688.40
කල්බදු ඉඩම්	8.1	18,591,742.11	19,370,783.21
ආයෝජන හා ඉතිරිකිරීම්	9	531,497.24	1,804,310.56
දිගුකාලීන ලැබිය යුතු වත්කම්	10	1,969,607.45	-
		211,841,631.73	**113,101,782.17**
ජංගම වත්කම්			
භාණ්ඩ තොගය - ලිපි ද්‍රව්‍ය		961,545.39	847,118.77
ආපදා ණය නැවත ගෙවීම්		-	470,734.14
ලැබියයුතු ගිණුම්	11	10,426,783.25	9,048,548.64
ඉදිරියට කළ ගෙවීම්	12	640,803.89	543,062.95
මුදල් හා මුදල්වලට සමාන දෑ	13	6,190,966.96	15,613,666.58
		18,220,099.49	**26,523,131.08**
මුළු වත්කම්		**230,061,731.22**	**139,624,913.25**
වගකීම්			
ජංගම නොවන වගකීම්			
පාර්තෝෂික වෙන්කිරීම්		66,134,780.00	59,270,622.50
ව්‍යාපෘති ගිණුම්වල අතිරික්තය	14-A	1,456,238.27	1,868,850.27
ජාතික ළමා ආරක්ෂක අරමුදල	14-B	2,095,500.24	603,377.27
		69,686,518.51	**61,742,850.04**
ජංගම වගකීම්			
උපචිත වියදම්	15	2,865,411.81	3,146,749.75
කෙටිකාලීන වෙන් කිරීම්	16	1,266,153.50	2,069,525.14
		4,131,565.31	**5,216,274.89**
මුළු වගකීම්		**73,818,083.82**	**66,959,124.93**
ශුද්ධ වත්කම්		**156,243,647.40**	**72,665,788.32**
මූල්‍යනය වන්නේ			
ප්‍රාග්ධන ප්‍රදානයන්	17	41,957,104.80	53,405,510.34
ප්‍රත්‍යාගණන සංචිත		166,669,981.25	34,038,634.65
රඳවාගත් ඉපැයුම්		(52,383,438.65)	(14,778,356.67)
		156,243,647.40	**72,665,788.32**

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

		රුපියල්	රුපියල්
විස්තර කොරතුරු	**සටහන්**	**2022**	**2021**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය			
සාමාන්‍ය ක්‍රියාකාරකමවලින් ජනනය වූ අතිරික්තය / (ඌනතාවය)		(10,255,583.66)	(826,261.71)
<u>පෙර වසරේ ගැලපුම්</u>			
රඳවාගත් ඉපැයීම්		(2,528,957.51)	(21,386,079.17)
ප්‍රාග්ධන ප්‍රදානයන්		(11,077.53)	21,852,684.05
මුදල් නොවන සංචලනයන්			
ක්ෂයවීම්	8	12,166,941.82	11,645,216.14
කල්බදු ඉඩම් ක්‍රමක්ෂය	8.1	779,041.10	779,041.10
පරිත්‍යාගවලින් ලැබූ ස්ථාවර වත්කම්		(6,199,100.00)	(7,882,665.28)
නැවත තක්සේරු කළ ස්ථාවර වත්කම්		(83,832,231.70)	(33,683,917.00)
වත්කම් ඉවත් කිරීමේ ක්ෂය		(1,675,054.64)	(1,861,333.94)
ප්‍රාග්ධන ප්‍රදාන පරිත්‍යාග		2,663,600.00	7,882,665.28
ක්‍රමක්ෂය වූ ප්‍රාග්ධන ප්‍රදාන		(12,945,982.92)	(12,109,165.59)
ක්‍රමක්ෂය වූ ව්‍යාපෘති අරමුදල්		(436,612.00)	(1,911,310.06)
ක්‍රමක්ෂය වූ ප්‍රත්‍යාගණන සංචිත		83,829,147.45	33,316,393.55
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය			
ගෙවියයුතු ගිණුම්වල වැඩිවීම් / (අඩුවීම්)		(281,337.94)	(2,954,374.05)
කෙටිකාලීන වෙන් කිරීම් වැඩිවීම් / (අඩුවීම්)		(348,000.00)	(31,360.00)
තොග වැඩිවීම් / (අඩුවීම්)		(114,426.62)	575,747.96
ලැබිය යුතු ගිණුම්වල වැඩිවීම් / (අඩුවීම්)		1,299,352.99	(4,601,482.54)
ඉදිරියට කළ ගෙවීම් වැඩිවීම් / (අඩුවීම්)		(97,740.94)	(21,214.38)
පාරිතෝෂික දායකය		8,431,387.50	7,889,925.00
පාරිතෝෂික ගෙවීම්		(1,551,867.50)	(2,471,543.00)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		**(11,108,502.10)**	**(5,799,033.64)**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්			
ස්ථාවර වත්කම් මිලදී ගැනීම්		(1,581,276.30)	(3,518,775.66)
ස්ථාවර වත්කම් ඉවත් කිරීම්		1,689,216.41	1,913,765.74
දිගුකාලීන ලැබිය යුතු ගිණුම්වල (වැඩිවීම් / අඩුවීම්)		(1,969,607.45)	58,676.82
ආයෝජන ප්‍රතිලාභ		1,272,813.32	4,026,687.38
ස්ථාවර තැන්පතු වැඩිවීම		(2,677,587.60)	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහයන්		**(3,266,441.62)**	**2,480,354.28**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්			
ඩේලි මිරර් සුනාමි අනුග්‍රාහක ප්‍රතිපාදන	14	24,000.00	1,024,000.00
ප්‍රාග්ධන ප්‍රධාන ලැබීම්	17	4,928,244.10	3,800,000.00
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහයන්		**4,952,244.10**	**4,824,000.00**
මුදල් සහ මුදල්වලට සමාන දෑ වල ශුද්ධ අඩුවීම්		**(9,422,699.62)**	**1,505,320.64**
කාලපරිච්ඡේදයේ ආරම්භක මුදල් හා මුදල්වලට සමාන දෑ		**15,613,666.58**	**14,108,345.94**
කාලපරිච්ඡේදයේ අවසාන මුදල් සහ මුදල්වලට සමාන දෑ	**13**	**6,190,966.96**	**15,613,666.58**

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

රුපියල්

	ප්‍රාග්ධන ප්‍රදාන	ප්‍රත්‍යාගණන සංචිත	රඳවාගත් ඉපැයුම්	මුළු ස්කන්ධය
2021 ජනවාරී 01 දිනට ගලපන ලද ශේෂය	**53,832,010.65**	**722,241.10**	**(14,800,161.03)**	**39,754,090.72**
විස්තීර්ණ ආදායම				
වර්ෂය සඳහා ලාභය	-	-	(844,641.71)	(844,641.71)
අනෙකුත් මුළු විස්තීර්ණ ආදායම හෝ වියදම	(426,500.31)	33,316,393.55	866,446.07	33,756,339.31
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**53,405,510.34**	**34,038,634.65**	**(14,778,356.67)**	**72,665,788.32**
පෙර වර්ෂයේ වැරදි නිවැරදි කිරීම්	(9,835,710.87)	-	(24,625,097.05)	(34,460,807.92)
2022 ජනවාරී 01 වන දිනට ගලපන ලද ශේෂය	**43,569,799.47**	**34,038,634.65**	**(39,403,453.72)**	**38,204,980.40**
විස්තීර්ණ ආදායම				
වර්ෂය සඳහා ලාභය හෝ අලාභය	-	-	(10,458,527.42)	(10,458,527.42)
අනෙකුත් මුළු විස්තීර්ණ ආදායම හෝ වියදම	(1,612,694.67)	33,316,393.55	(2,521,457.51)	29,182,241.37
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**41,957,104.80**	**166,669,981.25**	**(52,383,438.65)**	**156,243,647.40**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	රු.	රු.
සටහන 1 අ	**2022**	**2021**
පුනරාවර්තන ප්‍රදාන - අනෙකුත් පරිත්‍යාගශීලී නියෝජිතායතන		
මහජන බැංකුව	36,612.00	552,975.00
සුනාමි අරමුදලේ ආදායම් (ඩෙලිමිරර්)	400,000.00	-
එකතුව	**436,612.00**	**552,975.00**

	රු.	රු.
සටහන 1 ආ	**2022**	**2021**
අනෙකුත් ආදායම්		
අමාත්‍යාංශය විසින් ප්‍රතිපූර්ණය කිරීම	3,607,000.00	3,911,784.75
පොලී ආදායම්	471,182.88	258,578.87
ආපදාණය පොලී	15,911.47	4,448.68
විවිධ ආදායම්	806,542.84	707,047.29
විලම්භීත ආදායම්	12,945,982.92	12,424,257.24
පරිත්‍යාග	290,040.75	-
අබලි භාණ්ඩ විකුණුම් ගිණුම	263,176.01	-
එකතුව	**18,399,836.87**	**17,306,116.83**

	රු.	රු.
සටහන 1 ආ	**2022**	**2021**
අමාත්‍යාංශය විසින් ප්‍රතිපූර්ණය කිරීම පිළිබඳ විස්තර		
සමාජ ආරක්ෂණ ක්‍රියාකාරී සැලැස්ම	2,782,000.00	3,911,784.75
ගාස්තු රහිත පැය 24 ළමා උපකාරක සේවය - ක්‍රියාකාරී සැලැස්ම	825,000.00	-
එකතුව	**3,607,000.00**	**3,911,784.75**

	රු.	රු.
සටහන 1 ඇ	**2022**	**2021**
ලැබීම් - ජාතික ළමා ආරක්ෂක අරමුදල		
ජාතික ළමා ආරක්ෂණ අරමුදල	202,943.76	18,380.00
එකතුව	**202,943.76**	**18,380.00**

සටහන 2- පරිපාලන වියදම්	රු.	රු.
සටහන 2.1	**2022**	**2021**
සේවක පඩිනඩි		
කාර්යමණ්ඩල වැටුප් හා වේතන	150,370,123.67	143,995,583.53
සේ.අ.අ.	21,946,994.27	21,009,553.80

සේ.භා.අ.	5,505,663.97	5,252,388.52
මාසික දීමනා	24,313,244.51	3,022,669.16
විශේෂ දීමනා (Cool Allowance)	34,507.60	33,938.00
අතිකාල	2,122,907.24	2,805,415.09
නිවාඩු දින ගෙවීම්	92,519.25	201,051.75
ජීවන වියදම් දීමනා	31,660,927.39	30,986,155.09
පාරිතෝෂික දායක මුදල්	8,431,387.50	7,889,925.00
වැඩ බැලීමේ ගෙවීම්	4,911,951.87	4,814,652.01
ආධුනික පුහුණුවන්නන් සඳහා දීමනා ගෙවීම්	1,357,750.00	610,000.00
ඉන්ධන සහ වාහන දීමනා	9,354,746.29	5,951,581.60
එකතුව	**260,102,723.56**	**226,572,913.55**

	රු.	රු.
සටහන 2.2	**2022**	**2021**
ගමන් වියදම්		
ගමන් වියදම් සහ සංයුක්ත දීමනා - දිස්ත්‍රික් නිලධාරීන්	3,443,212.27	2,716,432.30
කාර්යාල කාර්ය මණ්ඩලය	69,175.00	122,374.50
වාහන කුලී ගාස්තු	364,897.18	318,087.46
විදේශ ගමන් වියදම්	182,928.00	-
ප්‍රවාහනය	-	18,150.00
එකතුව	**4,060,212.45**	**3,175,044.26**

සටහන 3 - අනෙකුත් මෙහෙයුම් වියදම්	රු.	රු.
සටහන 3.1	**2022**	**2021**
සැපයුම් සහ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය		
ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	2,736,262.52	2,459,401.75
දිස්ත්‍රික් නිලධාරීන් සඳහා ලිපිද්‍රව්‍ය	1,312,454.16	1,324,452.82
පුවත්පත්	218,710.00	66,540.00
ඉන්ධන	1,806,634.91	852,024.53
එකතුව	**6,074,061.59**	**4,702,419.10**

	රු.	රු.
සටහන 3.2	**2022**	**2021**
නඩත්තු වියදම්		
මෝටර්රථ	1,394,411.68	1,730,018.53
පරිගණක සහ උපකරණ	1,402,143.27	934,137.41
ගොඩනැගිල්ල සහ කාර්යාලය	549,073.00	399,520.77
එකතුව	**3,345,627.95**	**3,063,676.71**

	රු.	රු.
සටහන 3.3	**2022**	**2021**
කොන්ත්‍රාත්ගත සේවා		
දුරකථන ගාස්තු	5,204,289.21	5,572,625.93
මුද්දර සහ තැපැල් ගාස්තු	401,940.00	410,430.00
විදුලිය	2,682,785.18	2,329,186.35
ජලගාස්තු	252,955.92	195,226.35
රක්ෂණය	707,939.48	689,258.83
ආරක්ෂක සේවා	3,444,924.83	3,237,991.81
සනීපාරක්ෂක සේවා	1,641,179.00	1,603,082.50
ප්‍රචාරණය	-	395,118.00
මුද්‍රණ ගාස්තු	275,988.00	1,080.00
පරිවර්තන ගාස්තු	1,112.50	34,912.50
වරිපනම් සහ බදු	105,454.38	81,699.38
විගණන ගාස්තු	450,000.00	414,000.00
අධ්‍යක්ෂ මණ්ඩල වියදම්	639,348.00	693,068.00
සම්මුඛ පරීක්ෂණ මණ්ඩල ගාස්තු	123,800.00	106,244.00
විගණන හා කළමනාකරණ කමිටුව	105,128.00	99,603.00
වෙබ් අඩවි නඩත්තුව	418,378.60	442,987.59
සේවා ගිවිසුම - පරිගණක සහ අනෙකුත්	501,354.23	400,933.41
1929 ආහාර දීමනාව	215,400.00	110,800.00
එකතුව	**17,171,977.33**	**16,818,247.65**

	රු.	රු.
සටහන 3.4	**2022**	**2021**
ක්ෂය/ක්‍රමක්ෂය		
බදු දේපළ	779,041.10	779,041.10
ගොඩනැගිලි	1,050,872.85	1,050,872.85
මෝටර්රථ	4,844,500.00	4,354,083.00
ලී බඩු	1,549,539.13	2,058,872.29
උපකරණ	3,186,178.87	3,077,477.37
SAIEVAC ව්‍යාපෘතිය		
- ගෘහභාණ්ඩ	2,750.00	2,750.00
UNDP ව්‍යාපෘතිය		
- උපකරණ	267,399.79	-
UNICEF ව්‍යාපෘතිය		
- මෝටර්රථ	660,300.00	745,700.00
- උපකරණ	374,004.18	124,063.63
GIZ -මෝටර් රථ	211,300.00	211,300.00
SAVE THE CHILDREN - උපකරණ	20,097.00	20,097.00
එකතුව	**12,945,982.92**	**12,424,257.24**

	රු.	රු.
සටහන 3.6	**2022**	**2021**
NPA - වියදම් ක්‍රියාත්මක කිරීම		
ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ දත්ත පද්ධතිය නඩත්තු කිරීම	1,626,153.13	760,457.06
ළමා ආරක්ෂාව සුවිශේෂ වූ විධිවිධාන සැලැස්ම	8,161,261.53	8,698,602.71
ළමා සංවර්ධන මධ්‍යස්ථාන නියාමනය සහ අධීක්ෂණය, ළමා අපයෝජන වැළැක්වීම සහ පසු විපරම්	8,960,902.59	4,061,926.09
ළමා අපයෝජන පැමිණිලි භාර ගැනීම සහ ළමා ආරක්ෂාව තහවුරු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම	2,142,984.20	3,810,699.05
ළමුන්ට එරෙහි සහසිකත්වයට අදාළ දැනුම මෙහෙයවීම, ප්‍රවර්ධනය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම	61,825.75	50,180.50
සුනාමි ආපදා සහන වැඩසටහන පැවැත්වීම	1,088,037.20	1,566,008.00
ළමා ආරක්ෂාව සඳහා සංවර්ධන වැඩසටහන්, වැඩමුළු, සාකච්ඡා සහ අනෙකුත් දෑ.	1,681,749.50	1,119,748.37
ජා.ළ.ආ.අ. සේවකයින්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් සහ නඩත්තු කටයුතු	2,454,751.50	638,117.50
ජා.ළ.ආ.අ. ළමුන් සඳහා සමාජ ආරක්ෂණ වැඩසටහන්	825,000.00	3,911,784.75
පැය 24 ගාස්තු රහිත ළමා උපකාරක දුරකථන සේවා ක්‍රියාකාරී සැලැස්ම	2,782,000.00	-
එකතුව	**29,784,665.40**	**24,617,524.03**

	රු.	රු.
සටහන 3.5	**2022**	**2021**
අනෙකුත් මෙහෙයුම් වියදම්		
විවිධ වියදම්	245,187.10	32,898.00
සභාපති - සංග්‍රහ වියදම්	535,181.89	643,778.00
එකතුව	**780,368.99**	**676,676.00**

	රු.	රු.
සටහන 4	**2022**	**2021**
ව්‍යාපෘති වියදම්		
සිතුවිලි සිත්තම් වියදම් 2021	36,612.00	552,975.00
සුනාමි අනුග්‍රාහක දීමනා ඩෙලි මිරර්	400,000.00	-
එකතුව	**436,612.00**	**552,975.00**

	රු.	රු.
සටහන 5	**2022**	**2021**
ජාතික ළමා ආරක්ෂක අරමුදලේ වියදම්		
ජාතික ළමා ආරක්ෂක අරමුදලේ ගෙවීම්	-	-
එකතුව	**-**	**-**

	රු.	රු.
සටහන 6	**2022**	**2021**
මූල්‍ය වියදම්		
බැංකු ගාස්තු	-	-
එකතුව	**-**	**-**

	රු.	රු.
සටහන 7	**2022**	**2021**
කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/(හිඟය)		
කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/ (ඌනතාවය) - මහා භාණ්ඩාගාරය	(10,458,527.42)	(844,641.71)
කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/(ඌනතාවය) - ව්‍යාපෘති	-	-
කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/ ජාතික ළමා ආරක්ෂක අරමුදල	202,943.76	18,380.00
එකතුව	**(10,255,583.66)**	**(826,261.71)**

සටහන 8					රු.
දේපළ, පිරියත සහ උපකරණ	2022/1/1 දිනට ඉ/ගෙ ශේෂය	එකතු කිරීම	ඉවත් කිරීම්	පූර්ව වර්ෂයේ ගැලපීම්	2022/12/31 දිනට ප/ගෙ ශේෂය
පිරිවැය / තක්සේරු කිරීම					
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය					
ගොඩනැගිලි	52,543,643.30	136,375,875.00	(52,543,643.30)	-	136,375,875.00
මෝටර් රථ	48,445,000.00	-	-	-	48,445,000.00
ගෘහ භාණ්ඩ	16,592,401.88	1,252,406.30	(179,498.31)	-	17,665,309.87
උපකරණ	58,245,310.48	3,864,370.00	(282,350.99)	-	61,827,329.49
	175,826,355.66	**141,492,651.30**	**(53,005,492.60)**	**-**	**264,313,514.36**
ව්‍යාපෘතිවලින් ලත් ස්ථාවර වත්කම්					
පුනරුත්ථාපන ව්‍යාපෘතිය - ගෘහභාණ්ඩ	501,446.00	-	-	-	501,446.00
ILO - ළමා ජාවරම් වැළැක්වීමේ ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ	754,701.00	-	-	-	754,701.00
ILO - පරියේෂණ ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ	6,969.00	-	-	-	6,969.00
සුනාමි පරිත්‍යාග ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ	2,232,158.65	-	-	-	2,232,158.65
සුනාමි පුහුණු ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ	1,035,193.00	-	-	-	1,035,193.00
චර්යා පද්ධති ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ	96,275.00	-	-	-	96,275.00
PCN ව්‍යාපෘතිය - පරිගණක	2,121,560.00	-	(1,042,377.11)	-	1,079,182.89

SAIEVAC ව්‍යාපෘතිය					
- ගෘහභාණ්ඩ	79,147.50	-	-	-	79,147.50
- උපකරණ	85,757.00	-	-	-	85,757.00
UNDP ව්‍යාපෘතිය					
- ගෘහභාණ්ඩ	33,112.80	-	-	-	33,112.80
- උපකරණ	1,782,665.28	-	-	-	1,782,665.28
UNICEF ව්‍යාපෘතිය					
- මෝටර් රථ	8,378,609.00	-	-	-	8,378,609.00
- උපකරණ	8,549,634.68	2,663,600.00	(184,990.00)	-	11,028,244.68
GIZ - මෝටර් රථ	2,113,000.00	-	-	-	2,113,000.00
SAVE THE CHILDREN - උපකරණ	133,980.00	-	-	-	133,980.00
	27,904,208.91	**2,663,600.00**	**(1,227,367.11)**	**-**	**29,340,441.80**
එකතුව	**203,730,564.57**	**144,156,251.30**	**(54,232,859.71)**	**-**	**293,653,956.16**

සටහන 8 තවදුරටත්

රු.

ක්ෂය වෙන් කිරීම්	2022/1/1 දිනට ඉ/ගෙ ශේෂය	2022 වසර සඳහා ක්ෂය ප්‍රතිපාදන	ඉවත්කිරීම්	පූර්ව වර්ෂයේ ගැලපීම්	2022/12/31 දිනට ප/ගෙ ශේෂය
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය					
ගොඩනැගිලි	16,360,405.07	1,050,872.85	(17,411,277.92)	-	-
මෝටර්රථ	13,639,980.20	4,844,500.00	(1,979,314.20)	-	16,505,166.00
ගෘහභාණ්ඩ	13,184,253.49	1,549,539.13	(170,336.54)	-	14,563,456.08
උපකරණ	49,034,058.62	3,186,178.87	(277,350.99)	-	51,942,886.50
	92,218,697.38	**10,631,090.85**	**(19,838,279.65)**	**-**	**83,011,508.58**
ව්‍යාපෘතිවලින් ලත් ස්ථාවර වත්කම්					
පුනරුත්ථාපන ව්‍යාපෘතිය - ගෘහභාණ්ඩ	501,446.00	-	-	-	501,446.00
ILO ළමා ජාවාරම් වැලැක්වීමේ ව්‍යාපෘතිය - ගෘහභාණ්ඩ	754,701.00	-	-	-	754,701.00
ILO පර්යේෂණ ව්‍යාපෘතිය - ගෘහභාණ්ඩ	6,969.00	-	-	-	6,969.00
සුනාමි පරිත්‍යාග ව්‍යාපෘතිය - ගෘහභාණ්ඩ	2,232,158.65	-	-	-	2,232,158.65
සුනාමි පුහුණු ව්‍යාපෘතිය - ගෘහභාණ්ඩ	1,035,193.00	-	-	-	1,035,193.00
චර්යා පද්ධති ව්‍යාපෘතිය - ගෘහභාණ්ඩ	96,275.00	-	-	-	96,275.00
PCN ව්‍යාපෘතිය - පරිගණක	2,121,560.00	-	(1,042,377.11)	-	1,079,182.89
SAIEVAC ව්‍යාපෘතිය					
- ගෘහ භාණ්ඩ	79,147.50	-	-	-	79,147.50

- උපකරණ	81,007.00	2,750.00	-	-	83,757.00
UNDP ව්‍යාපෘතිය					
- ගෘහ භාණ්ඩ	33,112.80	-	-	-	33,112.80
- උපකරණ	-	267,399.79	-	-	267,399.79
UNICEF ව්‍යාපෘතිය					
- මෝටර්රථ	2,367,309.00	660,300.00	-	-	3,027,609.00
- උපකරණ	8,342,861.95	374,004.18	(184,990.00)	-	8,531,876.13
GIZ - මෝටර්රථ	1,901,700.00	211,300.00	-	-	2,113,000.00
SAVE THE CHILDREN - උපකරණ	31,737.89	20,097.00	-	-	51,834.89
	19,585,178.79	**1,535,850.97**	**(1,227,367.11)**	**-**	**19,893,662.65**
එකතුව	**111,803,876.17**	**12,166,941.82**	**(21,065,646.76)**	**-**	**102,905,171.23**

සටහන 8 තවදුරටත්.			රු .
ශුද්ධ පොත් අගයන්	පිරිවැය	සමුච්චිත ක්ෂය	ශුද්ධ පොත් අගය
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය			
ගොඩනැගිලි	136,375,875.00	-	136,375,875.00
මෝටර්රථ	48,445,000.00	16,505,166.00	31,939,834.00
ගෘහභාණ්ඩ	17,665,309.87	14,563,456.08	3,101,853.79
උපකරණ	61,827,329.49	51,942,886.50	9,884,442.99
	264,313,514.36	**83,011,508.58**	**181,302,005.78**
ව්‍යාපෘති වලින් ලත් ස්ථාවර වත්කම්			
පුනරුත්ථාපන ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ	501,446.00	501,446.00	-
ILO ළමා ජාවාරම් වැලැක්වීමේ ව්‍යාපෘතිය - ගෘහභාණ්ඩ	754,701.00	754,701.00	-
ILO පර්යේෂණ ව්‍යාපෘතිය - ගෘහභාණ්ඩ	6,969.00	6,969.00	-
සුනාමි පරිත්‍යාග ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ	2,232,158.65	2,232,158.65	-
සුනාමි පුහුණු ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ	1,035,193.00	1,035,193.00	-
චර්යා පද්ධති ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ	96,275.00	96,275.00	-
PCN ව්‍යාපෘතිය - පරිගණක	1,079,182.89	1,079,182.89	-
SAIEVAC ව්‍යාපෘතිය			
- ගෘහභාණ්ඩ	79,147.50	79,147.50	-
- උපකරණ	85,757.00	83,757.00	2,000.00

UNDP ව්‍යාපෘතිය			
- ගෘහභාණ්ඩ	33,112.80	33,112.80	-
- උපකරණ	1,782,665.28	267,399.79	1,515,265.49
UNICEF ව්‍යාපෘතිය			
- මෝටර් රථ	8,378,609.00	3,027,609.00	5,351,000.00
- උපකරණ	11,028,244.68	8,531,876.13	2,496,368.55
GIZ - මෝටර් රථ	2,113,000.00	2,113,000.00	-
SAVE THE CHILDREN - උපකරණ	133,980.00	51,834.89	82,145.11
	29,340,441.80	**19,893,662.65**	**9,446,779.15**
එකතුව	**293,653,956.16**	**102,905,171.23**	**190,748,784.93**

සටහන 8.1 රු.

කල්බදු දේපළ	**කල් බදු කාල පරිච්ඡේදය (වර්ෂ)**	**බදු පිරිවැය**	**පසුගිය වර්ෂය සඳහා සමුච්චිත ක්‍රමක්ෂය**	**ඉ/ගෙ ශේෂය**	**2022 වර්ෂය සඳහා ක්‍රමක්ෂය වෙන් කිරීම්**	**ප/ගෙ ශේෂය**
කල්බදු දේපළ (2000)	50	8,422,459.89	3,705,882.36	4,716,577.53	168,449.20	**4,548,128.33**
කල්බදු දේපළ (2016)	30	18,317,757.08	3,663,551.40	14,654,205.68	610,591.90	**14,043,613.78**
		26,740,216.97	**7,369,433.76**	**19,370,783.21**	**779,041.10**	**18,591,742.11**

	රු.	රු.
සටහන 9	**2022**	**2021**
ආයෝජන සහ ඉතිරි කිරීම්		
පාරිතෝෂික අරමුදල් ආයෝජන ගිණුම - 261605	231,037.56	1,743,758.92
සුනාමි ඉතුරුම් ගිණුම - 679016	62,393.29	60,551.64
ආපදා ණය ඉතුරුම් ගිණුම - 89945554	238,066.39	-
එකතුව	**531,497.24**	**1,804,310.56**

	රු.	රු.
සටහන 10	**2022**	**2021**
දිගුකාලීන ලැබීම්		
ආපදා ණය	1,969,607.45	-
එකතුව	**1,969,607.45**	**-**

	රු.	රු.
සටහන 11	**2022**	**2021**
ලැබිය යුතු ගිණුම්		
උත්සව අත්තිකාරම්	156,750.00	261,000.00
මුදල් අත්තිකාරම්	2,103,641.19	3,391,812.58
ලැබිය යුතු ගිණුම්	186,371.63	513,477.64
ලැබිය යුතු ආපදා ණය	461,908.21	58,676.81
ස්ථාවර තැන්පතු	7,501,169.21	4,823,581.61
ලැබිය යුතු - ළමා ආරක්ෂක අරමුදල	16,943.01	-
එකතුව	**10,426,783.25**	**9,048,548.64**

රු. රු.

සටහන 12	2022	2021
පූර්ව ගෙවීම්		
රක්ෂණය	366,228.37	377,054.29
සේවා ගිවිසුම	274,575.52	166,008.66
එකතුව	**640,803.89**	**543,062.95**

රු. රු.

සටහන 13	2022	2021
මුදල් සහ මුදල් සමාන දෑ		
ලංකා බැංකුව -ජංගම ගිණුම 228076	4,806,172.21	11,852,259.83
- ජංගම ගිණුම 71252941	843,270.01	2,843,882.01
මහජන බැංකුව -ජංගම ගිණුම 174-1-001-4-0347385	541,524.74	917,524.74
එකතුව	**6,190,966.96**	**15,613,666.58**

සටහන - 14 A

ව්‍යාපෘති අරමුදල් ශේෂ -විස්තරය

රු.

ව්‍යාපෘතියේ නම	ඉ/ගෙ ශේෂය	පූර්ව වර්ෂයේ ගැලපීම්	2022		ප/ගෙ ශේෂය
			අරමුදල්/ලැබීම්	වියදම්	
සුනාමි අනුග්‍රාකත්වය - Daily Mirror	917,524.74	-	24,000.00	(400,000.00)	541,524.74
Child Fund	504,300.53	-	-	-	504,300.53
මහජන බැංකුව - සිතුවිලි සිත්තම්	447,025.00	-	-	(36,612.00)	410,413.00
එකතුව	**1,868,850.27**	**-**	**24,000.00**	**(436,612.00)**	**1,456,238.27**

සටහන -14 B
ළමා ආරක්ෂක අරමුදල -
ගිණුම් සාරාංශය

රු.

අරමුදල	ඉ/ගෙ ශේෂය	පූර්ව වර්ෂය	ලැබීම් (සටහන-1C)	වියදම් (සටහන 12)	අතිරික්තය/ (හිහය) 2022 වසර සඳහා	ප/ගෙ ශේෂය
ජාතික ළමා ආරක්ෂක අරමුදල	603,377.27	1,289,179.21	202,943.76	-	202,943.76	2,095,500.24

	රු.	රු.
සටහන 15	**2022**	**2021**
උපචිත වියදම්		
අතිකාල	171,037.06	325,952.98
ආරක්ෂක සේවා	297,122.96	307,336.31
සනීපාරක්ෂක සේවා	141,060.00	148,041.25
ගමන් වියදම් සහ සංයුක්ත දීමනා	810,704.38	1,018,200.00
විදුලි වියදම්	233,846.50	234,531.80
ජලය	4,628.93	2,448.24
ලිපි ද්‍රව්‍ය	48,250.00	50,000.00
ළමා ආරක්ෂක අරමුදලේ ප්‍රධාන ගිණුමේ	16,943.01	-
දුරකථන වියදම්	437,604.73	566,288.36
විවිධ ණය හිමියෝ	577,400.00	209,922.39
වෙබ් අඩවි නඩත්තුව	26,214.24	41,249.24
පුවත්පත් වියදම්	28,100.00	13,190.00
නිවාඩු දින ගෙවීම්	-	8,029.50
ආධුනිකයන් පුහුණු කිරීම සඳහා දීමනා	72,500.00	73,500.00
ගෙවිය යුතු වැටුප්	-	148,059.68
එකතුව	**2,865,411.81**	**3,146,749.75**

	රු.	රු.
සටහන 16	**2022**	**2021**
කෙටි කාලීන වෙන් කිරීම්		
විගණන ගාස්තු සඳහා වෙන් කිරීම්	450,000.00	798,000.00
ආපදාණය ආපසු ගෙවීම් සඳහා වෙන් කිරීම්	-	470,734.14
කෙටි කාලීන පාරිතෝෂික අරමුදල් සඳහා වෙන් කිරීම්	816,153.50	800,791.00
එකතුව	**1,266,153.50**	**2,069,525.14**

රු.

සටහන 17	**2022/1/1** දිනට ඉ/ගෙ ශේෂය	**2022** වසර සඳහා ලැබීම්	**2022** වසර සඳහා වියදම්	පූර්ව වර්ෂයේ ගැලපීම්	**2022/12/31** දිනට ප/ගෙ ශේෂය
යෙදවූ ප්‍රාග්ධනය					
ප්‍රාග්ධන ප්‍රදාන					
රජයේ ප්‍රදාන - ප්‍රාග්ධනය	20,074,604.87	1,392,744.10	(6,084,482.52)	15,699.18	15,398,565.63
බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලය - ගොඩනැගිලි	10,163,413.80		(338,780.46)	(9,824,633.34)	-
UNICEF - ප්‍රදාන	433,572.73	2,663,600.00	(430,704.18)	-	2,666,468.55
GIZ - ප්‍රදාන	211,300.00		(211,300.00)	-	-
UNDP - ප්‍රාග්ධන ප්‍රදාන	1,782,665.28		(267,399.79)	-	1,515,265.49
ප්‍රාග්ධන ප්‍රදාන - වත්කම් අත්පත් කර ගැනීමේ/සංවර්ධනය කිරීමේ කටයුතු	13,202.00		(4,950.75)	-	8,251.25
ප්‍රාග්ධන ප්‍රදාන - කල්බදු දේපළ	14,654,205.67		(610,591.90)	-	14,043,613.77
SAVE THE CHILDREN - ප්‍රාග්ධන ප්‍රදාන	102,242.11		(20,097.00)	-	82,145.11
අමාත්‍යාංශ ප්‍රදාන (ප්‍රාග්ධන අත්පත් කර ගැනීම්)	226,136.88	3,535,500.00	(626,232.17)	(26,776.71)	3,108,628.00
ජනාධිපති කාර්යාලය විසින් ලබාදුන් මෝටර් රථ	5,744,167.00	-	(610,000.00)	-	5,134,167.00
එකතුව	**53,405,510.34**	**7,591,844.10**	**(9,204,538.77)**	**(9,835,710.87)**	**41,957,104.80**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. VOT/B/NCPA/01/2022/10 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2023 මැයි 31 දින

සභාපති

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්වාගණනය කළ මතය

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සමාලෝචිත වර්ෂය තුළදී රජයේ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ලැබී තිබුණු රු.32,420,000 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනා ගැනීමට හා ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී ඇලුමිනියම් කබඩ් සවිකිරීම සඳහා ගෙවන ලද රු.1,481,639ක්, දේපළ පිරියත හා උපකරණ යටතේ ප්‍රාග්ධනීත කිරීම වෙනුවට අයහාර වියදමක් ලෙස ලාභයට එරෙහිව කපා හැරීම නිසා ප්‍රවර්තන වර්ෂයේ ලාභය හා දේපළ පිරියත හා උපකරණ වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රත්‍යාගණන සංචිත ගිණුමේ ශේෂය රු.135,279,060ක් විය යුතු වුවද ප්‍රාග්ධන ප්‍රදාන රු.35,132,366 ක් හා ක්‍රමක්ෂය රු.3,741,444 ක් ප්‍රත්‍යාගණන සංචිත ගිණුමට වැරදි සහගත ලෙස පිළිවෙලින් බැර හා හර කිරීම හේතුවෙන් ප්‍රත්‍යාගණන සංචිත ගිණුමේ ශේෂය රු.31,390,922 ක් අඩුවෙන් දැක්වුණි. එම වරද හේතුවෙන් ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම රු.35,132,366ක් අඩුවෙන් හා විලම්භීත ආදායම් ගිණුම රු.3,741,444ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ඈ) ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ රඳවා ගත් ලාභයෙන් රු.1,289,179ක් ජාතික ළමා ආරක්ෂක අරමුදලට මාරුකර තිබුණද ඊට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඉ) 2010 වර්ෂයේ සිට වැඩ තහනමට ලක් වී සිටි ගණකාධිකාරිවරිය 2022 වර්ෂයේ නැවත සේවයේ පිහිටුවීම හේතුවෙන් ඇයට හිඟ වැටුප් ලෙස රු.8,781,059 ක මුදලක් ගෙවීමට සිදු වී තිබූ අතර ඒ සඳහා ප්‍රතිපාදනයන් මූල්‍ය ප්‍රකාශන වල සිදු කර නොතිබුණි.එම ගෙවිය යුතු හිඟ වැටුප් මුදලින් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවන ලද රු.4,027,143 ක මුදල රඳවා ගත් ලාභයට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගැලපීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේම තව දුරටත් ගෙවිය යුතු රු.4,753,916 ක් වූ හිඟ වැටුපට අදාලව මූල්‍ය ප්‍රකාශන තුළ වෙන්කිරීම් සිදුකර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී.මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම ,මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ තත්වාගණනය කල මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 අධිකාරියේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබා ගත් අධිකාරියේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර, මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ.මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනා ගැනීමේ දී හා තක්සේරු කිරීමේ දී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන් ,වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුනද ,අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලදී.

  භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙලිදරව් කිරීම් අගයන ලදී.

සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුලත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබිණි.

2.1.2 2018 අංක 19 දරන විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිරීදේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරියට සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

	නීතිරීති/විධානයට යොමුව	නිරීක්ෂණ
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i)	මුදල් රෙගුලාසි 104	2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයෙන් හඳුනාගන්නා ලද අස්ථාන ගත වූ ලැප්ටොප් පරිගණකය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ii)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) (ආ)	කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු 100,000 ක උපරිමයක් දක්වා තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබා දිය යුතු වුවද, එකී සීමාව ඉක්මවා අවස්ථා 06 කදී එකතුව 941,900 ක අත්තිකාරම් ලබා දී තිබුණි.
(iii)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371	නිකුත් කරන ලද අග්‍රිම පියවීම එය දෙන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩියෙන් ප්‍රමාද නොකළ යුතු වුවද, 2022 වර්ෂය තුලදී අවස්ථා 107 කදී නිකුත් කළ එකතුව රු.2,103,641 ක් වූ අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

බලතල,කර්තව්‍යය, කාර්යයන්		නිරීක්ෂණ
(අ)	1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක පනත	
(i)	පනතේ 14(අ)(ආ)(ඇ)(ඊ) වගන්ති	2019 ඔක්තෝබර් 29 දින අනුමැතිය ලැබී ඇති ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාල පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී කටයුතු කර නොතිබුණි.
(ii)	පනතේ 14(ඔ) වගන්තිය	ජාතික ළමා ආරක්ෂක අධිකාරියට 2021 ජනවාරි 01 සිට 2022 දෙසැම්බර් 31 දක්වා ලද පැමිණිළි අතුරින් 10,691 ක්, එනම් සියයට 47 ක් නොවිසිදුණු පැමිණිළි ලෙස පැවතුණු අතර විමර්ශන අංශය, මනෝ සමාජීය අංශය හා නීති අංශයට ලද පැමිණිළි අතරින් සියයට 50 කට අධික ප්‍රමාණයක් විමර්ශනය වෙමින් පැවතුණි. සමාලෝචිත වර්ෂය තුල අපචාර හා හිංසන පැමිණිළි 10,497 ක් ලැබී තිබුණද ඉන් අපචාර 6731 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අවසන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.2.4. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2.3. වෙනත් කරුණු

(අ) 2014 වර්ෂයේ සිට ජාතික ළමා ආරක්ෂක අධිකාරියට භාවිතයට ගන්නා ලෙස වාචිකව පවරන ලද මුලතිවු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ගොඩනැගිල්ල වාර්තාවේ දිනය දක්වාම කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව පැවතුණු අතර එම ගොඩනැගිල්ලට ආරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී පමණක් රු. 865,680 ක් වැය කර තිබුණි.

(ආ) 2016 වර්ෂයේදී වර්ෂ 30ක කල් බදු කාලයක් සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියට යාබද ඉඩම රු. 18,317,757 ක වටිනාකමකට මිළදීගෙන තිබුණද එම ඉඩම් මේ දක්වාම කිසිදු කාර්යයකට යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) 2022 වර්ෂය තුළදී ක්‍රියාකාරී සැලැස්මේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත නිකුත් කළ අත්තිකාරම්වලින් එකතුව රු. 1,789,090 ක් එනම් සියයට 54 ක් භාවිතා නොකර නිශ්කාර්යව පැවතුණි.

(ඈ) ළමා අපචාර වැළැක්වීමේ කාර්ය සඳහා සහ එවැනි අපචාර වලට ගොදුරු වූවන් ආරක්ෂා කිරීම, ඔවුන්ගේ අයිතීන් රැක ගැනීම සහ ගතයුතු සියළු ක්‍රියාමාර්ග ගැනීම වෙනුවෙන් 2010 වර්ෂයේදී ජාතික ළමා ආරක්ෂක අරමුදල පිහිටුවා තිබුණ ද 2018 වර්ෂයේ සිට අරමුදලෙහි මුදල් අදාල අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් වැය කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන දින වන විට අරමුදලෙහි රු.2,905,500 ක ශේෂයක් පැවතුණි.

(ඉ) 2022 දෙසැම්බර් 31 දිනට ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය 618 ක් වුවද ඉන් නිළධාරීන් 287 ක එනම් සියයට 46 ක කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතුණි. ඉන් ළමා අපචාර සම්බන්ධයෙන් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරන ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිළධාරීන් 148 දෙනෙකුගේ පුරප්පාඩු 2021 වර්ෂයේ සිට පැවතුණි. ඒ අනුව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ විශාල මානව සම්පත් හිඟයක් පැවතීම අධිකාරියේ කාර්යයන් ඉටු කිරීමට බාධාවක් වී තිබුණි.

(ඊ) 2016 වර්ෂයේ රු.මිලියන 1.2 ක් වියදම් කර කොළඹ විශ්වවිද්‍යාලය මගින් ළමා අපචාර සම්බන්ධව සකස් කළ දත්ත පද්ධතිය ඵලදායී ලෙස භාවිතයට ගැනීමට නොහැකි වී ඇත. එබැවින් 2021 වර්ෂයේදී නව ජාතික දත්ත පද්ධතියක් සකස් කිරීම සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වෙත භාර දී තිබූ අතර එහි මුළු පිරිවැය රු.1,403,255 ක් විය. මේ හේතුවෙන් පැරණි දත්ත පද්ධතිය සඳහා වැය කළ රු.මිලියන 1.2 ක මුදල නිෂ්කාර්ය වියදමක් බවට පත් වී තිබුණි.

(උ) ආන්තික, අවදානම් සහගත, අවදානමට ලක්විය හැකි සහ ළමා අපයෝජනයට ගොදුරු වූවන් සඳහා අධ්‍යාපනික ආධාර හෝ අදාළ සහාය ලබාදීම සඳහා ළමුන් 1000 ක් ඉලක්ක කරගෙන සමාලෝචිත වර්ෂය තුළදී රු. 4,000,000 ක් වෙන් කර තිබුණද ළමුන් 417 දෙනෙකු සඳහා රු. 1,514,000 ක මුදලක් පමණක් ලබා දී තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති